# බළන්ගොඩ නගර සභාව

## 2022-02-07 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.02.07**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රුමී මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රි | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රි | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රි | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රීනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්.එච්.ඒ.කරුණාරත්න මිය |

**01. පසුගිය සභාවේ 2022-01-11 දිනැති මහා සභා වාර්තාව හා 2022.01.21 දිනැති විශේෂ මහ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව 2022-01-11 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-01-21 දින පැවති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා විසින් 2022-01-11 දින පැවති මහ සභාවේ සභා වාර්තාව අයවැය පරාද වූ සභාපතිවරයෙක් ඉදිරිපත් කළ වාර්තාවක් වන බැවින් හා එම වාර්තාවේ සියල්ල ප්‍රතික්ෂේප කරන බැවින් සත්‍ය වාර්තාවක් නොවන බව ද එම නිසා 2022-01-11 දිනැති මහ සභා වාර්තාව ප්‍රත්ක්ෂේප කරන බවට යෝජනා කරන බව ද පැවසීමෙන් අනතුරුව එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා, 2022-01-21 දින පැවති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2022-01-21 දින පැවති විශේෂ මහ සභාවේ සභා වාර්තාව සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- අද දින විශේෂ දවසක් වන අතර,කාලයක් නගර සභාවේ කටයුතු අඩාලව අකර්මන්‍ය වී තිබුණු බව ද මහජනතාව පත් කර එවූ අය වශයෙන් එම නාගරික ජනතාවට සේවය කිරීමේ බලාපොරොත්තුවෙන් වැඩ කටයුතු කළ යුතු බවද එම කටයුතු පසුගිය කාලයේ සිදු නොවුනේ දේශපාලන අර්බුදයන් නිසා මිස පෞද්ගලික මති මතාන්දර නිර්මාණය කරගෙන ජනතාවට වැඩ නොකිරීම නිසා නොවන බව ද එම දේශපාලන අර්බුදයෙන් සභාව මිදුනු අතර, මින් ඉදිරියට කෙටි කාලීන සැලසුමක් සකස් කර පවතින බව ද එය ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී කණ්ඩායම දන්නා බව ද ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලය රැස් කර අවශ්‍ය උපදෙස් ලබා දුන් බව ද කමිටු පත් කිරීම අද දින සිදු වන අතර, එහි දී සාධාරණව, අවශ්‍ය ප්‍රායෝගික දැනුම හා ඉදිරි සැලසුම්වලට වගකීම බාරගෙන කටයුතු කරන අය පත් කරගන්නා ලෙස ද මින් ඉදිරියට එම කමිටුවලින් ගරු මන්ත්‍රීවරුන්ට බලය පැවරීම තුළින් කටයුතු කිරීමට හැකි වන අතර, ඒ සඳහා අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවා යි ප්‍රාර්ථනා කරන බව ද පවසන ලදී.

**පෙ.ව 10.12 ට පමණ ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

- අසනීප තත්ත්වයක් හේතුවෙන් 2022-02-07 දින මහ සභාවට සහභාගී නොවන බවත්, නිවාඩු අනුමත කර දෙන ලෙසත්, ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය සහ ගරු නාගරික මන්ත්‍රිනී එම්. ශාන්තිලේඛා මැතිතුමිය විසින් කරන ලද ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදුව නිවාඩු අනුමත කරන ලදී.

  මෙහි දී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා, රජයේ පිළිගත් වෛද්‍යවරයෙකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකයක් පවතින්නේ නම් පමණක් සභික දීමනාව ගෙවන ලෙස යෝජනා කරන බව පැවසූ අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

  ගරු සභාපතිතුමා මේ සම්බන්ධව අදහස් දක්වමින් පැවසුවේ අද දින නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්ට පමණක් නොව මෙම තීරණය සියලුම දෙනාට පොදු වන බවයි.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- බළන්ගොඩ, බාන්ස් රත්වත්ත මාවත, අංක 37/20 ලිපිනයේ පදිංචි ශ්‍යාමා සිරිනි යන අයගේ නිවස අසල පැති බැම්මේ නගර සභාව විසින් ඉදි කරන කොටස සමගම පතුල ද කොන්ක්‍රීට් කර කාණුව සම්බන්ධ ගැටලුවට ස්ථිර විසඳුමක් හැකි ඉක්මනින් ලබා දෙන ලෙසත්, එමඟින් නිවස කඩා වැටීමේ අවදානම පහව යන බවත් පවසා ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මේ සම්බන්ධව අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, නගරයේ ජලය බැහැර කරන කාණුව මෙම ස්ථානයේ පවතින අතර, වැසි ජලය ගලා ඒම නිසා කාණුව හැරෙන බවත්, බැම්ම සහ නිවස අතර කුඩා ඉඩක් පවතින බැවින් කාණුවේ පතුල කොන්ක්‍රීට් කර දෙන ලෙස පසුගිය සභාවක දී සඳහන් කළ බවත් පැවසීය.

  මෙහි දී ගරු සභාපතිතුමා, ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමෙන් අනතුරුව අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස වැඩ අධිකාරීතුමාට පවසන ලදී.

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.**

**05. කල් දී ඇති ප්‍රශ්න**

**05:01 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා**

05:01:01 අතුරු ව්‍යවස්ථාව අනුව කටයුතු කරන්නේ ද?

ගරු සභාපතිතුමා මෙයින් අදහස් කරන්නේ කුමක්දැයි ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගෙන් විමසන ලදී.

ඒ අනුව අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා, නගර සභාවක් පාලනය කිරීම සඳහා නගර සභා ආඥා පනතක් පවතින අතර, ඊට අමතරව අතුරු ව්‍යවස්ථා

සම්මත කරගෙන පවතින බව ද මෙම අතුරු ව්‍යවස්ථාවෙන් බලාපොරොත්තු වන්නේ නගරය අලංකාරව පවත්වාගෙන යාම බව ද එහි දී එළවළු, පලතුරු හා මස් මාළු යනාදිය නගර සභා සීමාව තුළ නගර සභාව විසින් ලබා දෙනු ලබන ස්ථානයක මිස වෙනත් ස්ථානවල විකිණීම තහනම් බව සඳහන්ව ඇති බව ද මෙම අතුරු ව්‍යවස්ථාව පිළිබඳ සභාවෙහි නිරන්තරව කතා කළ ද හිටපු ගරු සභාපතිතුමා මේ සම්බන්ධව මඟ හැරි බව ද හැම ස්ථානයකම කුකුල් මස් කඩ පවතින බව ද පැවසීය.

එමෙන්ම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා සෑම මසකට වරක්ම සම්බන්ධීකරණ රැස්වීම පවත්වන නමුත් යහපාලන ආණ්ඩුව පාලනය කල අවුරුදු 04 ක කාල සීමාවේ දී සම්බන්ධීකරණ රැස්වීම දෙවරක් පමණක් පැවති අතර, ඉන් එක් අවස්ථාවක දී මෙම ගැටලුව පැන නැඟුණු බව ද විශේෂයෙන් පොළෙහි බුදු මැදුර ඉදිරිපිට තිබෙන මස් කඩ ගැන විමසූ අවස්ථාවේ දී දෙසැම්බර් 31 වන විට මෙම සියලුම මස් කඩ වසා දමන බවට පොරොන්දු වූ බව ද අද වන විට පොදු වෙළඳසැල වැසී ගොස් ඇති බව ද එසේ වැසී ඇත්තේ තමන් විසින් පොළ පවතින ස්ථානයට එළවළු වෙළෙන්දන් යොමු කිරීම නිසා බවට එතුමා පැවසුව ද එය එසේ නොවන බව ද පොදු වෙළඳසැල පිටුපස ඔවුන් සිටි බැවින් එසේ වන්නේ නම් මීට පෙර පොදු වෙළඳසැල වැසෙනු ඇති බව ද එය වැසී ගියේ සෑම ස්ථානයකම එළවළු විකුණන නිසා බව ද පරණ බස් නැවතුම්පළ කඩ 05 ක හා 06 ක එළවළු වෙළඳාම සිදු කිරීමට ඉඩ දී ඇති අතර, මෙවැනි අයථා දේ සිදු වීම සම්බන්ධව හිටපු ගරු සභාපතිතුමා වගකිව යුතු බව ද පදික වෙළඳාම සිදු වනවාට තමන් අකමැති බැවින් ඉරිදා පොළෙහි කඩ සකස් කර දුන් බව ද එය පිළිවෙලකට පවතින අතර, කඩ පෙළක් ඉදි කිරීම සම්බන්ධව විරුද්ධ වූ බව ද සියලුම දේ එක ස්ථානයක පවතින්නේ නම් සියලුම දෙනා එම ස්ථානයට පැමිණෙන බවද නගර සභා ආඥා පනත හා අතුරු ව්‍යවස්ථා අනුව නගරය පාලනය කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා තවදුරටත් අදහස් දක්වමින් තමන් තවත් ප්‍රශ්න කීපයක් කල් දී ඇති ප්‍රශ්න යටතේ අසා තිබුණු අතර, එම ප්‍රශ්න න්‍යාය පත්‍රයට ඇතුලත් නොකිරීමට හේතු දක්වමින් ලිපියක් එවා ඇති බව ද ඉන් එක් ප්‍රශ්නයක් වන්නේ "සම්පත් පියස යාබද කඩ කාමරය ඉල්ලූ අයට ලබා දීම" වන අතර, ඒ සම්බන්ධව පසුගිය සභාවන්හි දී සිදු කරන ලද සාකච්ඡාවන් නැවත සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙහි දී ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පසුගිය සභා වාර්තා සියලුම දෙනා කියවා ඇති බැවින් නැවත පැවසීම අවශ්‍ය නොවන බවද 2021-12-09 දිනැති මහ සභාවේ අංක 06:01:29 යටතේ වැඩ කරන දින 07ක් තුළ අදාල හිඟ මුදල් ගෙවන ලෙසත්, ගෙවීමට අපොහොසත් වන්නේ නම් කඩ කාමරය සභාවට පවරා ගන්නා බවත් දන්වමින් ජේ. ඩේවිඩ් යන අයට ලිපියකින් දනුම් දී ඇති අතර, ඒ අනුව ඔහු විසින් දින 07 ක් ඇතුලත එම මුදල් ගෙවා අවශ්‍ය කටයුතු සිදු කර ඇති බැවින් වෙන කළ යුතු දෙයක් නොමැති බවද සභාපතිවරයා වශයෙන් තමන් සභාවේ සම්ප්‍රදාය අනුව නිර්පාක්ෂිකව වැඩ කටයුතු කරන බව ද කඩයක් දීමේ දී හෝ රැකියාවක් දීමේ දී පළාත් පාලන ආයතනයක අනුගමනය කරනු ලබන ක්‍රමවේදය අනුව තමන්

කටයුතු කරන බව ද එම ක්‍රමවේදය ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා පවා දන්නා බව ද පැවසීය.

නැවත අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා,ගිවිසුමක් කඩ කළ අයෙකුට නැවත කඩයක් ලබා දිය නොහැකි අතර, එය ක්‍රමවේදය වන බව ද තමන්ගේ ඥාතියෙකු ආපනශාලාව කරගෙන යාමේ දී මාස දෙකක් කුලිය නොගෙවා ඇති බව පවසමින් නිළධාරීන් විසින් ආපන ශාලාව වැසූ අතර, එය හිටපු සභාපතිවරයා පවා නොදන්න වූ බව ද ගිවිසුම් අත්සන් කළ දිනයන් බලන ලෙස ද පවසන ලදී.

මෙහි දී ගරු සභාපතිතුමන් පිළිතුරු ලබා දෙමින් ගිවිසුම අත්සන් කිරීම සම්බන්ධව තමන් සමග නොව හිටපු සභාපතිවරයා සමඟ කතා කරගන්නා ලෙස ද එසේ නැතිනම් උසාවි යන ලෙස ද සභාව කරගෙන යාමට ඉඩ දෙන ලෙස ද රැකියාවක් ලබා දීමේ දී නම් කරනු ලබන අයෙකුට නොව නිසි ක්‍රමවේදයකට අනුව සුදුසුකම් සපුරා ඇති අයට ලබා දෙන බව ද පසුගිය කොරෝනා වසංගතය පැවති කාලයේ දී මිනිසුන්ගේ සාමාන්‍ය කටයුතු අඩාල වූ බැවින් බැංකු ණය පවා ගෙවා ගැනීමට නොහැකි වූ බව ද මෙම ප්‍රශ්න හේතුවෙන් හිටපු ගරු සභාපතිතුමාට පවා යම් යම් තීරණයන් ගැනීමට සිදු වූ බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා පැවසූවේ මෙම කාරණය සම්බන්ධයෙන් සභාව විසින් තීරණයක් ගෙන ඒ අනුව අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කර ඇති බවයි.

**පෙ.ව 10.29 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

## 06. කල් දී ඇති යෝජනා

### 06:01 ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා

06:01:01 පහත සඳහන් බලතල, රාජකාරී හා වගකීම් පැවරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

i. නගර සභා ආඥා පනතින් හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවකින්, රීතියකින්, නියෝගයකින් හෝ වෙනයම් ලිඛිත නීතියකින් සභාවට පැවරී ඇති සියලු කාර්ය හා බලතල, සභාව වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම උදෙසා සභාපතිවරයාට පැවරීම

ii. රු. 250,000.00 ක් දක්වා වන සභාවේ සියලු වියදම් දැරීම සඳහා වූ සියලු බලතල ගරු සභාපතිවරයාට පැවරීම

iii. රු. 250,000.00 සිට රු. 500,000.00 දක්වා වූ වියදම් මුදල් කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව සිදු කිරීමට සභාපතිවරයාට බලය පැවරීම

iv. අවස්ථානුකූලව තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කිරීම සඳහා වූ සියලු බලතල ගරු සභාපතිවරයාට පැවරීම

v. සභාවේ සහ සභාපතිවරයාගේ බලතල නිළධාරීන්ට පැවරීම

vi. සභාවේ සහ සභාපතිවරයාගේ බලතල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී වෙත පැවරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06ඃ01ඃ02 කාරක සභා පත්කිරීම**

**06ඃ01ඃ02;01 මුදල් කමිටුව පත් කිරීම හා බලතල පැවරීම.**

**මුදල් කමිටුවට පැවරෙන බලතල හා විෂය පථය**

බළන්ගොඩ නගර සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන්ට අදාලව රුපියල් දෙලක්ෂ පනස් දහස (රු.250,000.00) සිට රුපියල් ලක්ෂ පහ (රු. 500,000.00) දක්වා වූ වියදම් අනුමත කිරීම, රුපියල් දෙලක්ෂ පනස් දහස (රු.250,000.00) සිට රුපියල් ලක්ෂ පහ (රු. 500,000.00) දක්වා වූ ඇස්තමේන්තු අනුමත කිරීම, ගරු සභාපතිවරයා විසින් සිදු කරනු ලබන රුපියල් දෙලක්ෂ පනස් දහස (රු.250,000.00) සිට රුපියල් ලක්ෂ පහ (රු. 500,000.00) දක්වා වූ ගෙවීම් වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබාදීම, කර්මාන්ත කමිටුව, පුස්තකාල හා උපදේශන කමිටුව, සෞඛ්‍ය සණ අපද්‍රව්‍ය හා පරිසර කමිටුව, සංවර්ධන උපදේශන කමිටුව යන කමිටු වලින් නිර්දේශ කරනු ලබන රුපියල් දෙලක්ෂ පනස් දහස (රු.250,000.00) සිට රුපියල් ලක්ෂ පහ (රු. 500,000.00) දක්වා වූ වියදම් සඳහා අනුමැතිය ලබාදීම, රු. 250,000.00 සිට රු. 500,000.00 දක්වා වූ ප්‍රසම්පාදන කමිටුව ලෙස ක්‍රියාත්මක වීම, නගර සභා ආඥා පනත, රජයේ විවිධ රෙගුලාසි, චක්‍රලේඛ, අතුරු ව්‍යවස්ථා හා රීතින් වලට අනුකූල වන පරිදි ආදායම් උත්පාදනය, ආදායම් ඒකරාශී කිරීම, වියදම් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම හා පාලනය කිරීම, මූල්‍ය ස්ථාවරත්වය ගොඩ නැගීම සඳහා වන යෝජනා ගරු සභාවට ඉදිරිපත් කිරිම හා ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම උදෙසා,

1. ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා
2. ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය
6. ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය
7. ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා

යන සාමාජිකයින් හත් දෙනෙකුගෙන් සමන්විත මුදල් කමිටුව පත් කිරීම සඳහා වන යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06ඃ01ඃ02;02 කර්මාන්ත කමිටුව**

නගර සභාව විසින් බල ප්‍රදේශය තුළ ඉටු කළ යුතු කර්මාන්ත සම්බන්ධව ප්‍රමුඛතා හඳුනාගෙන නිර්දේශ කිරීම, ප්‍රගතිය අදාළ පරිදි මුදල් කමිටුවට හා ගරු සභාවට ඉදිරිපත් කිරීම, කර්මාන්ත පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම, තෝරා ගන්නා ලද කර්මාන්තකරුවන් පිළිබඳ නිර්දේශ ලබාදීම යන කාර්යයන් ඉටු කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා වූ

1. ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා
2. ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී ඊ.එම්.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා - කර්මාන්ත කමිටුවේ සභාපති
4. ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා

යන සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත කර්මාන්ත කමිටුව පත් කිරීම සඳහා වන යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06ඃ01ඃ02;03 පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව**

බළන්ගොඩ නගර සීමාව තුළ මහජනතාවට පොදුවේ බලපානු ලබන සෞඛ්‍ය ගැටලු පිළිබඳ සොයා බැලීම ඒවාට විසඳුම් යෝජනා කිරීම සහ නගරය පිරිසිදු කිරීම සම්බන්ධව පරීක්‍ෂා කිරීම හා වාර්තා කිරීම, බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පරීක්‍ෂා කිරීම, වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ ලබාදීම, පාරිසරික සංරක්‍ෂණ කාර්යයන් හඳුනා ගැනීම සහ ඒ සඳහා නිර්දේශ මුදල් කමිටුවට හා සභාවට ඉදිරිපත් කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් කාර්යයන් ඉටු කිරීම යන කරුණු උදෙසා

1. ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා
2. ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය - කමිටුවේ සභාපති
4. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා

6. ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා

යන සාමාජිකයින් හය දෙනෙකුගෙන් සමන්විත පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව පත් කිරීම සඳහා වන යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06ඃ01ඃ02;04 පුස්තකාල උපදේශන කමිටුව පත්කිරීම**

පුස්තකාල පොත් මිලදී ගැනීමට නිර්දේශ ලබා දීම, පාඨක සමාජයේ යෝජනා සම්මත කර ගැනීම, පුස්තකාල සංවර්ධන කටයුතු සාකච්ඡා කර යෝජනා මුදල් කමිටුවට /ගරු සභාවට ඉදිරිපත් කිරීම, පුස්තකාල සාමාජික ගාස්තු අඩු හෝ වැඩි කිරීම සාකච්ඡා කර නිර්දේශ ඉදිරිපත් කිරීම, සඟරා නිකුත් කිරීමේ දී ලිපි ලබාගැනීම සහ සංස්කරණ කටයුතු සඳහා සහභාගි කර ගැනීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා

**ගරු නාගරික මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන්ගේ නියෝජනය**

1. ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා - කමිටුවේ සභාපති
3. ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රිනී එම්.ජී. ශාන්තිලේඛා මැතිතුමිය
5. ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය
6. ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය
7. ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය

**ප්‍රජා නියෝජනය**

8. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක
9. ඩබ්.ඒ.ජයතිලක මහතා
10. ටී.එම්. නෙයිසූර් මිය
11. ධර්මසේන සමරසිංහ මයා
12. එච්.ඒ.බී.අයි. සිරිවර්ධන මයා
13. එම්.ජී.එස්.ඩී. නාවනැල්ල මයා
14. ඉන්ද්‍රානි වීරසේකර මිය
15. අනිල් අල්විස් මයා
16. එම්.ජෙයරාජන් මයා

17. කුසුමා අබේසිංහ මිය
18. ඒ.එල්.අක්බර් අලී මයා
19. ඉන්ද්‍රානි එස්.රත්නායක මිය
20. දයානන්ද බෙනරගම මයා
21. නලීන් ජයසේකර මයා

යන සාමාජිකයන් 21 කින් සමන්විත පුස්තකාල උපදේශන කමිටුව පත් කිරීම සඳහා වන යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රී.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06ඃ01ඃ02;05 සංවර්ධන උපදේශන කමිටුව පත්කිරීම**

බළන්ගොඩ නගර සභා සීමාව තුළ පවතින සියලු සංවර්ධන කටයුතු සඳහා සහ ගරු සභාවේ උන්නතිය, ආදායම් ඒකරාශි කිරීම/ආදායම් මාර්ග වැඩිදියුණු කිරීම ආදී සියලු සේවාවන් සඳහා උපදේශනය ලබාදීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා

1. ගරු සභාපති ඩබ්. ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා
2. ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී රී.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා

**ප්‍රජා නියෝජනය**

8. ගරු පූජ්‍ය මෛත්‍රීමූර්ති ස්වාමීන් වහන්සේ
9. ගරු පූජ්‍ය පියනන්ද ස්වාමීන් වහන්සේ
10. මුස්ලිම් ප්‍රධාන පල්ලියේ පූජකතුමා
11. බළන්ගොඩ නගර සභාවේ හිටපු ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මහතා
12. විශ්‍රාමික විදුහල්පති එම්.ජෙයරාජන් මහතා
13. ආර්.කේ.ඩී. ජයසිංහ මහතා
14. ෆාරුක් හාජ්ජියාර් මහතා
15. බී. එම්. ගුණතිලක මහතා

16. විල්ෆ්‍රඩ් සිසිල් මහතා
17. හර්ෂණ හෙට්ටිආරච්චි මහතා
18. ග්‍රාම නිළධාරී සෙනරත් මහතා (බළන්ගොඩ නගර වසම)
19. නිහාල් ෆොන්සේකා මහතා
20. නිල්මිණි වනසේකර මිය
21. ඉන්ද්‍රානි රත්නායක මහත්මිය

යන සාමාජිකයන් 21 කින් සමන්විත සංවර්ධන උපදේශන කමිටුව පත් කිරීම සඳහා වන යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06ඃ01ඃ02;06 කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුව**

රුපියල් 250,000.00 දක්වා කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුව ලෙස,

1. ගරු සභාපති, ඩබ්.ජ්. වසන්ත ගුණරත්න මැතිතුමා
2. ලේකම්, එස්.එච්.ජ්.කරුණාත්න මිය
3. ගණකාධිකාරී, එම්. ඩී. එස්. ප්‍රනාන්දු මයා
4. ප්‍රධාන කළමනාකරණ සහකාර, ජී. ඩී. ජ්. සේමපාල මිය
5. වැඩ අධිකාරී, පී.එම්.එස්.සේනාධීර මයා
6. පුස්තකාලාධිපතිනි, උමුදුනි විදානපතිරණ මිය
7. මහජන සෞඛ්‍ය පරීක්ෂක, ඒ.එම්.සී.එල්.ආඳාදොළ මයා
8. පෙර පාසල් පාලිකා, ඩබ්.එම්.සෙව්වන්දි සමන්මලී වීරසිංහ මිය
9. ආයුර්වේද වෛද්‍ය නිලධාරිනි ඩබ්. ඩබ්. සධානා සංජීවනී පුෂ්පකුමාරි මිය

යන සාමාජිකයින්ගෙන් යුත් කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටු පත් කිරීම සඳහා වන යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:03** ගබඩා අවශ්‍යතා සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| **ද්‍රව්‍ය** | **ප්‍රමාණය** |
|---|---|
| 13.6 x 28 Tyre | 04 |
| 12 x 28 | 02 |
| 650 x 16 Tyre | 04 |
| 700 x 15 Tyre | 02 |
| 750 x 15 Tyre | 02 |
| 650 x 15 Tyre | 03 |
| 600 x 16 Collors | 03 |
| 700 x 16 Collors | 03 |
| 750 x 16 Collors | 03 |
| 600 x 16 Tractor Tyre | 02 |
| 195 x 15 Van Tyre | 04 |
| වෙනත් ආදායම් ලේඛන | 10 |
| ෆයිල් ටැග් | 2000 |
| දෙපියන් ෆයිල් (නිල්) | 100 |
| බෝල්පොයින්ට් පෙන් | 500 |
| 10 × 7 ලියුම් කවර | 100 |
| 10 × 15 ලියුම් කවර | 100 |
| ටිපෙක්ස් | 12 |
| Magazine holder 6" | 75 |
| Magazine holder 3" | 75 |
| ක්ෂේත්‍ර සටහන් පොත් | 50 |
| අතිකාල දීමනා කොළ | 1000 |
| අඩි රූල් | 20 |
| සෙලෝටේප් පොඩි | 50 |
| කාබන් කොළ | 500 |
| ගලි සේවා සැපයීමේ කොළ | 50 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06෴01෴04 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම.

- 227-5020 ගලි බවුසරය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ.ඉංජිනියරින් ඇන්ඩ් කේ.ඒ. ඔටෝ ක්ලීන් ආයතනය වෙත රු.22,400.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- 56-1906 කෘෘ කැබ් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ.ඉංජිනියරින් ඇන්ඩ් කේ.ඒ. ඔටෝ ක්ලීන් ආයතනය වෙත රු.13,740.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- PF 4006 කැබ් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ.ඉංජිනියරින් ඇන්ඩ් කේ.ඒ. ඔටෝ ක්ලීන් ආයතනය වෙත රු.16,100.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- RE 2600 ට්‍රැක්ටර් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් රිෂානා සර්විස් ආයතනය වෙත රු.22,910.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- RC 1118, RB 4786, HF 8558 යන ට්‍රැක්ටර් රථවල වහල අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් පී.එම්.කේ. හාඩ්වෙයාර් වෙත රු.10,585.00, රු. 17,085.00 හා රු. 17,085.00 ක් වශයෙන් මුදල් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- RC 1118, RB 4786, HF 8558 යන ට්‍රැක්ටර් රථවල වහලයෙහි ටෙන්ඩ් එක ගැසීම වෙනුවෙන් ලාල් කුෂන් වෙත එකක් රු. 26,000.00 බැගින් රු. 78,000.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- රත්නපුර මහාධිකරණ නඩු අංක 15/2020 දරණ නඩුව සඳහා පෙනී සිටීම සහ විරෝධතා ගොනුකිරීම වෙනුවෙන් රු. 35,000.00 ක මුදලක් නීතිඥ තුෂාරි සූරියආරච්චි යන අය වෙත ගෙවීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

- රත්නපුර පාර නිල නිවාස සඳහා ජල නල හා සින්ක් එකක් මිල දී ගැනීම වෙනුවෙන් PMK හාඩ්වෙයාර් වෙත රු.10,250.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- කියවීම් ශාලාව තීන්ත ආලේප කිරීම සඳහා ද්‍රව්‍ය මිල දී ගැනීම වෙනුවෙන් ද පේන්ට් හවුස් වෙත රු. 20,150.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- 2021-12-08 දින දිනමිණ සහ තිණකරන් පුවත්පත්හි (මස් කඩ) ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් පල කිරීම වෙනුවෙන් සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමට රු. 79,164.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- 2021/12/31 දින දිනමිණ සහ තිණකරන් පුවත්පත්හි (මස් කඩ) ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් පළ කිරීම වෙනුවෙන් සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමට රු. 69,525.00 මුදලක් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

- 12.4-28 ප්‍රමාණයේ ට්‍රැක්ටර් ටයර් එකක් ලබා ගැනීම වෙනුවෙන් පෙරේරා ටයර් සර්විස් ප්‍රයිවට් ලිමිටඩ් වෙත රු. 55,020.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- ND 5124 රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ.ඉංජිනියරින් ඇන්ඩ් කේ.ඒ. ඔටෝ ක්ලීන් ආයතනය වෙත රු.16,914.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:05 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.

| දිනය | විස්තරය | වවුචර් අංකය | චෙක්පත් අංකය | මුදල රු. |
|---|---|---|---|---|
| 2021-12-01 | කේ. චාලට් මිය - කසළ ටෙන්ඩරය (2021-11-16 සිට 2021-11-30 දක්වා) | 01 | 082051 | 299,974.50 |
| 2021-12-02 | ඩයලොග් බ්‍රෝඩ් බෑන්ඩ් නෙට්වර්ක් වෙත ඔක්තෝම්බර් මස ක්ලවුඩ් ඉන්ටනෙට් බිල ගෙවීම | 04 | 082055 | 15,660.00 |
| 2021-12-02 | ඩයලොග් බ්‍රෝඩ් බෑන්ඩ් නෙට්වර්ක් වෙත නොවැම්බර් මස ඉන්ටනෙට් බිල ගෙවීම | 05 | 082055 | 17,821.02 |
| 2021-12-03 | අයි.ආර්.එන්. ඉඹුලෙගම මහතා - මාර්ග පුවරු හා ළමා උද්‍යාන සඳහා පුවරු සැකසීම | 09 | 082059 | 21,800.00 |
| 2021-12-07 | සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමිතිය -2021-10-21 සිට 2021-10-27 දක්වා | 47 | 082089 | 75,347.00 |
| 2021-12-07 | සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමිතිය -2021-11-01 සිට 2021-11-10 දක්වා | 48 | 082089 | 73,794.00 |
| 2021-12-07 | සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමිතිය -2021-10-18 සිට 2021-10-29 දක්වා | 49 | 082089 | 43,908.00 |
| 2021-12-09 | පෙර පාසල් දීමනා | 54-6 | 082103 | 10,000.00 |
| 2021-12-09 | දෛනික වැටුප් | 54-7<br>54-9<br>54-11<br>54-12 | 082103 | 187,656.73 |
| 2021-12-16 | කේ. චාලට් මිය - කසළ ටෙන්ඩරය (2021-12-01 සිට 2021-12-15 දක්වා) | 69 | 082085 | 299,974.50 |
| 2021-12-24 | බී.කේ.ජේ.එස්. අමරදාස මයා - 2021-11-01 සිට 2021-11-30 දක්වා ඉන්ධන බිල්පත් | 78 | 082157 | 194,921.71 |

| | | | | |
|---|---|---|---|---|
| 2021-12-24 | සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමිතිය -2021-11-13 සිට 2021-11-30 දක්වා | 79 | 082158 | 67,168.21 |
| 2021-12-24 | සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමිතිය -2021-11-11 සිට 2021-11-22 දක්වා | 80 | 082158 | 46,720.90 |
| 2021-12-24 | ලංකා විදුලි බල මණ්ඩලය (හෝරස්ථම්භය, සම්පත් පියස, බැංකියවත්ත, වැවවත්ත, පොදු වෙළඳසැල, මහජන පොළ, මුරකුටිය, වැසිකිළි,ප්‍රේක්ෂකාගාරය, බස්නැවතුම්පළ) | 86,91 | 082163<br>082164 | 34,570.00<br>31,758.15 |
| 2021-12-28 | පෝස්ට් මාස්ටර් ජනරාල් | 100 | 082169 | 10,000.00 |
| 2021-12-28 | කුමාරගම ගැමුණු එක්සත් අවමංගල්‍යාධාර සමිතිය | 103 | 082171 | 275,664.19 |
| 2021-12-30 | බී.කේ.ඩී.පී. ජිනදාස (පුස්තකාලයට පුවත්පත් සැපයීම) | 137 | 082189 | 11,790.00 |
| 2021-12-30 | කාර්යාලයීය දුරකතන බිල්, ඉන්ටනෙට් බිල් ගෙවීම - ඩයලොග් ආයතනය | 150 | 090951 | 18,169.40 |
| 2022-01-05 | කේ. චාලට් (කසළ ටෙන්ඩරය (2021-12-16 සිට 2021-12-31 දක්වා) | 03 | 090959 | 299,974.50 |
| 2022-01-10 | දෛනික වැටුප් (කර්මාන්ත) | 04 | 090960-<br>090963 | 119,950.00 |
| 2022-01-10 | දෛනික වැටුප් (බැංකියවත්ත) | 05-07 | 090960<br>090964 | 177,301.00 |
| 2022-01-10 | දෛනික වැටුප් (ප්ලාස්ටික්,පොලිතින්) | 08 | 090971<br>090960<br>090961 | 3,75014.00 |
| 2022-01-10 | සුසාන භූමි නඩත්තු දීමනා හා පෙර පාසල් දීමනා ගෙවීම | 09-10 | 090960<br>090961 | 60,000.00 |
| 2022-01-13 | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 16 | 090972 | 211,136.52 |
| 2022-01-21 | කේ.චාලට් ( කසළ ටෙන්ඩරය (2022-01-01 සිට 2022-01-16 දක්වා) | 86 | 091037 | 58,585.00 |
| 2022-01-31 | බොබ් කැට් යන්ත්‍රයේ ටයර් දැමීම ( C-Com Equipment (pvt) Ltd) | 88 | 091039 | 593,975.00 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:06 56-1906 කෘෘ කැබ් රථයේ ගියර් කනෙක්ටර් අලුතින් දැමීම, පවර් සවින්, ජියර් හැඩ්ල් සහ ටයර් රෝඩ් අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:07 HF 7899 ජේසීබී යන්ත්‍රයේ පහත අලුත්වැඩියාවන් සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- පසුපස බ්‍රම් එකේ ජැක් සීල් එකෙහි ඔයිල් කාන්දුව
- පසුපස බකට් එකේ හෝස් එකෙහි ඔයිල් කාන්දුව
- එක්ට්‍රා ඩිස් එකෙහි පිං එක අලුත්වැඩියාව
- ඇතුලත ජැක් එක, ඩීසල් ටැංකියේ හෝස් එක, හෙඩ් ලයිට්, මඩ් ගාඩ් අලුත්වැඩියා කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:08 67-1565 , 46-4907 ට්‍රේලර් අලුත්වැඩියාව සහ RC 1107, RE 2600, RC 8183, RD 8000, HF 8952 යන ට්‍රැක්ටර් රථවල වහලය අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:09 GK 1483 ට්‍රැක්ටර් රථය සඳහා 90 AMP බැටරියක් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:10 2022 ජනවාරි මස සිට ජූනි 30 දක්වා සභාව සතු වාහන සේවා කිරීම සඳහා සභාවේ වාහන සේවා සඳහා ලියාපදිංචි රිෂානා සර්විස් ආයතනයෙන් හා කේ.ඒ.ඉංජිනියරින් ඇන්ඩ් කේ.ඒ. ඔටෝ ක්ලීන් ආයතනය වෙතින් ඉදිරිපත් කර ඇති මිල ගණන් අනුමත කර අදාල සේවාව ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති කේ.ඒ.ඉංජිනියරින් ඇන්ඩ් කේ.ඒ. ඔටෝ ක්ලීන් ආයතනය වෙතින් ඉදිරි මාස 06 ක කාලය සඳහා වාහන සේවා කිරීම සුදුසු බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:11 බස් රථ ටෙන්ඩර්ය සම්බන්ධයෙන් වන ගාස්තුවලින් 2022 වර්ෂයේ පහත දිනයන් නිදහස් කර දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- 2022-02-04
- 2022 අප්‍රේල් මස 13,14,15,16,17 යන දිනයන්
- 2022-05-01 මැයි 01
- 2022-12-25 දින
- 2022 වසරේ සෑම මසකම පෝය දින

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, 2022 වර්ෂයේ ජාතික වෙසක් උත්සවය කුරගල භූමියේ පැවැත්වෙන අතර, මැයි මස වෙසක් පෝය දින විශාල බස් රථ ප්‍රමාණයක් නගරයෙන් ගමන් කරන බැවින් වෙසක් පෝය දින හැර වසරේ අනිකුත් මාසයන්හි පෝය දිනයන් අදාල ගාස්තුවලින් නිදහස් කිරීමේ ගැටලුවක් නොමැති බව පැවසීය.

ඒ අනුව,

- 2022-02-04
- 2022 අප්‍රේල් මස 13,14,15,16,17 යන දිනයන්
- 2022-05-01 (මැයි 01)
- 2022-12-25 දින
- 2022 වසරේ වෙසක් පෝය දින හැර අනිකුත් පෝය දිනයන්

බස් රථ ටෙන්ඩර්ය සම්බන්ධයෙන් වන ගාස්තුවලින් නිදහස් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:12 රට තුළ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2021-05-01 දින සිට 2021-10-31 දින දක්වා බස් රථ ධාවනය අඩු වූ බැවින් අය කිරීමට අපේක්ෂා කරනු ලබන මුදල අදාල ටෙන්ඩර්කරුගෙන් අය කර ගැනීම සඳහා 2022 ජනවාරි මස සිට මාස හතරක කාලයක් ලබා දීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:13 රට තුළ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ලබා දුන් සහන ප්‍රමාණවත් නොවන බැවින් අදාල රථ වාහන ටෙන්ඩර්කරු වන වී.සී.එස්.වීරසේකර යන අයට තවදුරටත් සහන ලබා දීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වූ ගරු සභාපතිතුමා, මෙම රථ වාහන ටෙන්ඩර්කරු විසින් ජූනි, ජූලි හා ඔක්තෝම්බර් මාසයන් සඳහා 100%ක ගාස්තු කපා හැරීමක් බලාපොරොත්තු වන බැවින් මේ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමටත්, අනුමැතිය ලබා දුනහොත් ගාස්තු කපා හැරීම සුදුසු බවටත් යෝජනා කළ අතර, එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:14 2022 වර්ෂය සඳහා බළන්ගොඩ මූලික රෝහලේ සූතිකාගාරයෙන් හා ශල්‍යාගාරයෙන් ඉවත දමන වැදෑ මහ හා මළ සිරුරු කොටස් වල දැමීමට රජය සතු සුසාන භූමියකින් ඉඩ කොටසක් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා මෙය පළාත් පාලන ආයතනයේ වගකීමක් ද යන්න විමසූ අතර, මේ සඳහා අවස්ථාව ලබා දුනහොත් අනවශ්‍ය බැඳීමක් ඇති කර ගැනීමක් වන බැවින් විරුද්ධ වන බව පැවසීය.

ගරු සභාපතිතුමා පැවසුවේ ඉල්ලීමක් ලැබුණු පසු සභාව දැනුවත් කිරීම සඳහා මෙම යෝජනාව ඇතුලත් කළ නමුත් මේ සඳහා ඉඩ කඩ ලබා දිය නොහැකි බවයි.

ඉහත යෝජනාව සඳහා පක්ෂව කරුණු ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ප්‍රතික්ෂේප විය.

06:01:15 ලේඛනාගාරයේ ලිපිගොනු ස්කෑන් කිරීමේ වැඩසටහනේ දත්ත Back up කිරීම සඳහා 1 TB External Hard Disk ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:16 එම්.වයි. රිෆාස් මොහොමඩ් යන අයට අයත් නව බස්නැවතුම්පළ බී 11 කඩ කාමරය අබ්දුල් රසාක් මොහොමඩ් අසීම් යන අයට පැවරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:17 පී.ඒ. ඇල්බට් කුරේ යන අයට අයත් සී 41 කඩ කාමරය ඩී.එම් නිෂාධ රුක්මාල් යන අය වෙත පැවරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:18 ඩොරීන් ජයසේකර යන අයට අයත් බස්නැවතුම්පළ සී 06 කඩ කාමරය එල්.ඩබ්. ෂමිලා යන අයට පැවරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:19 පදික කඩ කාමර අංක 185/19 ලබා ගෙන ඇති බී. සිරිපාල මහතා මියගොස් ඇති බැවින් ඔහුගේ බිරිඳ වන ඉන්ද්‍රා අනුලා ගීතාංජලී මහත්මියගේ නමට එම කඩය පවරා දීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:20 කාර්යාලයීය ගොඩනැගිල්ල තීන්ත ආලේප කිරීම හා පහත සඳහන් ද්‍රව්‍ය ඇස්තමේන්තුව වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

- W/S emulsion 40 L
- Brileant White 06 L
- Floor paint 06 L
- Enamal Paint(Door & Windoor) 08 L
- Enamal for Gate 04 L
- Varnish 03 L
- Scaper 2' 04
- Wire Brush 05
- Wall Piller 20 L
- Sand paper (120) 12
- Sand paper (80) 12

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:21 නගර සභා පෙර පාසලේ තීන්ත ආලේප කිරීම හා පහත සඳහන් ද්‍රව්‍ය ඇස්තමේන්තුව වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

- W/S emulsion 12 L
  (Yellow, Blue, Pink)
- Brileant White 06 L
- Enamal Paint (Wadimbu) 02 L
- Varnish 06 L
- Roller Brush 02
- 3" Brush 02
- 4" Brush 02
- 2" Brush 02
- Roof Paint 20 L
- Tinner 04 L
- Terpantine 04 L

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:22 නගර සභා පුස්තකාලයේ තීන්ත ආලේප කිරීම හා පහත සඳහන් ද්‍රව්‍ය ඇස්තමේන්තුව වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

- W/S emulsion 30 L
- Brileant White 20 L
- Enamal Paint (Wadimbu) 03 L
- Roller Brush 02
- 4" Brush 02
- 2" Brush 02
- Roof Paint 30 L
- Scaper 2' 02
- Tinner 04 L
- Floor paint 12 L
- Enamal Paint (Door & Windoor) 08 L
- Wall Filler 10 L
- Sand paper (120) 06
- Sand paper (80) 06
- Scaper 3' 01

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:23 නගර සභා පෙර පාසලේ ළමා උද්‍යානය ආවරණය වන පරිදි දැල සවි කිරීම හා ක්‍රීඩා භාණ්ඩ අලුත්වැඩියා කිරීම හා ඒ සඳහා වන ද්‍රව්‍ය ඇස්තමේන්තුව වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

- GI Pipe 1 ½ - 05
- GI Pipe 1 - 09
- Plastic Coted Net 4" - 100 '
- Plastic Coted foil - 5 kg
- Cutting wheel - 12
- ¼ x ½ Pattam - 04
- Enamal (Green) - 02L
- Tinner - 05L
- Cement - 03 Bag
- ¾ Stone - 1 cube
- Sand - ½ cube
- 3" Balt Nail - 30
- 4" Brush - 02
- 5" Brush - 02
- 2" Brush - 05
- 120 Sand Paper - 15
- 4.0' x 8.0' Alluminium Mal sheet - 01
- Enamal paint Green, Blue,Red, Yellow, Black - 5 L

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:24 පොදු වෙළෙඳසැල අංක 09 හා 10 හැර පහත සඳහන් මාළු කඩ ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

i. පොදු වෙළඳසැල අංක 11 මාළු කඩ කාමරය
ii. පොදු වෙළඳසැල අංක 12 මාළු කඩ කාමරය
iii. පොදු වෙළඳසැල අංක 14 මාළු කඩ කාමරය
iv. පොදු වෙළඳසැල අංක 18 මාළු කඩ කාමරය

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා, අවුරුදු 20 කට අධික කාලයක් අංක 09 හා 10 කඩ සඳහා නඩුවක් පැවති අතර, එම නඩුව දිනූ නමුත් යම්කිසි හේතුවක් මත එම කඩය නගර සභාවට බාර ගැනීමට නොහැකි වූ බව ද නැවත වරක් පියදාස මුදලාලි මිය ගිය පසුව ටෙන්ඩර් කළ අතර, නැවත නඩුවකට ගිය බව ද එම නඩුවෙන් දිනුව පසු නැවත අභියාචනාධිකරණයට ගිය බව ද මේ නිසා නීතිඥ ගාස්තු වශයෙන් විශාල මුදලක් වැය කර ඇති බව ද එකල සභාවට කුලිය අය කර ගත් නමුත් මේ වන විට කුලිය අයකර නොගන්නා බව ද ටෙන්ඩර් කරනවා යැයි පවසන කඩ සඳහා අසාධාරණයක් සිදු වන අතර, එම අය අවුරුදු 20-30 ක කාලයක්

වෙළඳාමේ නිරත වන බව ද නගර සභාවේ සභාපතිවරයාගේ අවසරයක්, බලපත්‍රයක් නොමැතිව කඩ ආරම්භ කළ නොහැකි බැවින් ගරු අමාත්‍ය රාජිත සේනාරත්න මැතිතුමාට බළන්ගොඩ ධීවර සංස්ථාවේ කඩයක් ආරම්භ කිරීමට නොහැකි වූ බවද එහි දී බළන්ගොඩ සිටින වෙළෙන්ඳන්ගේ පැත්තෙන් තමන් බැලූ බව ද සුරංග යන අය මාළු විකිණීමට ලෑස්ති වී නොසිටි බව ද පැවසීය.

ගරු සභාපතිතුමා මෙහි දී ප්‍රශ්නයක් ඉදිරිපත් කරමින් අතුරු ව්‍යවස්ථාව එම කාලයේ බැලුවේ නැද්දැයි විමසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා පිළිතුරු ලබා දෙමින් එම කාලයේ අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට වත්මන් ගරු සභාපතිතුමා ඉඩ නොදුන් බව ද අතීතය ගැන කතා නොකරන ලෙස ද අංක 11 කඩ කාමරය හැර අනිකුත් කඩ කාමර විසින් ජනවාරි සිට කඩ කුලිය ගෙවන බව ද කඩ කුලිය වැඩි කර ඇති බව ද ටෙන්ඩර් කිරීමකට ගියහොත් නඩුවකට යා හැකි බැවින් ගෙවනු ලබන කුලිය අහිමි විය හැකි බව ද වැඩි කළ මුදලට ගැනීමට කැමති නම් හා අනිකුත් මන්ත්‍රීවරු කැමති නම් නඩුව අවසන් වූ පසු කඩ සියල්ලම ටෙන්ඩර් කරන ලෙස ද ඒ සඳහා විරුද්ධ නොවන බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා පවසන පරිදි සෙමට හොඳ විය හැකි නමුදු පිතට නරක් විය හැකි නිසා මෙහි වගකීම් බාර ගත නොහැකි බව ද නීතිමය කටයුත්තකට විෂය වී ඇති අංක 09 හා 10 කඩ කාමර හැර ඉතිරි කඩ කාමර ටෙන්ඩර් කරන ලෙස පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා ලිපියකින් පවසා ඇති බැවින් එම ලිපියට අනුව කටයුතු කරන ලෙස ද කවුරුන් හෝ එය ටෙන්ඩර් නොකරන ලෙස කියන්නේ නම් එයට විරුද්ධ බව ද පැවසීය.

අනතුරුව මේ සම්බන්ධව කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, පොදු වෙළඳපොළ ආරම්භයේ දී මාළු කඩ කාමර ටෙන්ඩර් කිරීමේ කටයුතු සම්බන්ධව කරුණු විමසීමක් කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසුවේ එවකට හිටපු ගරු සභාපතිතුමා විසින් ටෙන්ඩර් කිරීම සඳහා නියෝගයක් ගරු අමාත්‍යතුමාගෙන් ලබා ගෙන ටෙන්ඩර් කළ අතර, එය වැරදි බවට අදාල අය උසාවි ගිය බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් පිටකොටුව මැනිං වෙළඳපොළේ එළවළු වෙළෙන්ඳන් හා මාළු වෙළඳපොළෙහි මාළු වෙළෙන්ඳන් සඳහා මෙම කඩ ලබා දීමට ගරු ජනාධිපති ආර්.ප්‍රේමදාස මැතිතුමාට අවශ්‍ය වූ අතර, ලේකම් වශයෙන් සිටි ආර්.පාර්ශිලිංගම් යන අය විසින් අයිතිකරු මිය ගියහොත් ඔහුගේ භාර්යාවටත්, ඇය මිය ගියහොත් දරුවන්ටත් වන ලෙස හා මෙම කඩ ගිවිසුම් කඩ කිරීම හැර කිසි දිනක ටෙන්ඩර් කිරීමට නොහැකි වන ලෙස චක්‍රලේඛයක් නිකුත් කළ බව ද එම චක්‍රලේඛය නොතිබුණේ නම් එළවළු කඩ, මාළු කඩ

හා මස් කඩ ටෙන්ඩර් කළ හැකි බව ද තමන් අවුරුදු 50 ක් පොදු වෙළඳපොළෙහි සිටි බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා නැවත වරක් අදහස් දක්වමින් 01/2009 චක්‍රලේඛය යටතේ ටෙන්ඩර් කිරීමට ගත් පසු නඩු දමමින් කඩ පවත්වාගෙන යන බව ද අවුරුද්දක කාලයක් පළාත් පාලන ආයතනවල ධූර කාලය දීර්ඝ වූ අතර, පොදු වෙළඳපොළෙහි එක් මාළු කඩ හිමියෙකුවත් ටෙන්ඩර් කිරීම සම්බන්ධව ඉල්ලීම් කර නොමැති බව ද සභාවේ තීන්දු තීරණ අරන් විගණනයට ලක් වී අධිභාරයක් වුවහොත් මෙයින් ඉවත් වූ පසුවත් මුදල් ගෙවීමට සිදු විය හැකි බව ද මාළු කඩ හිමියන් නොකරන ඉල්ලීමක් වෙනුවෙන් පෙනී සිටීම අවශ්‍ය නොවන බව ද සභාවේ තීරණයක් ගත යුතු බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා පැවසුවේ නීත්‍යානුකූල දේ කරන ලෙසයි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් මෙම අය දීර්ඝකාලයක් තිස්සේ මාළු වෙළඳාමේ සිටින අය වන අතර, ටෙන්ඩර් කිරීමේ දී නොයෙකුත් ප්‍රදේශවලින් පැමිණ ඒ අයගේ රැකියාව අහිමි වීමකට ලක් විය හැකි බැවින් මාළු වෙළෙන්දන් සඳහා සාධාරණයක් ඉෂ්ට විය යුතු බව ද එම මිනිසුන්ගේ දුවා දරුවන් ජීවත් විය යුතු බව ද සාධාරණයක් වන පරිදි ටෙන්ඩර් ක්‍රමවේදයක් සකස් කර දිය යුතු බව ද පැවසීය.

මේ පිළිබඳව අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා, බළන්ගොඩ බල ප්‍රදේශයට පමණක් සීමා වී ටෙන්ඩර් කරන ලෙස යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා, එයට සංශෝධනයක් ඉදිරිපත් කරන බව ද මාළු වෙළෙන්දන් කවුද යන්න හඳුනන බැවින් වෙනත් වෙළෙන්දන් ටෙන්ඩර් සඳහා අයදුම් කළහොත් සද්භාවයෙන් මාළු වෙළඳාම කරන අයට අවස්ථාව සලසා දෙන බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් මාළු නැති තැනක් නොමැති අතර, බයිසිකල්වලින් පවා වෙළඳාම් කරන බව ද පියදාස මුදලාලි සහ රං මහත්තයා යන අය හදාගත් වෙළඳාමක් කරගෙන යන බව ද මෙම අය බැංකුවලට පවා ණය වී ඇති බව ද පළාත් පාලන කොමසාරිස්තුමාට තනි තීරණයක් ගෙන ටෙන්ඩර් කිරීමට හැකි බව ද නඩුවල දී එතුමා ඉදිරිපත් නොවන අතර, කොමසාරිස්තුමා පළාත් පාලන ආයතනවල නඩුවලට වියදම් කළ යුතු බව ද මෙම නඩුවලට නගර සභාවෙන් වියදම් කිරීමට විරුද්ධ බව ද තමන් පුද්ගලිකව මෙම කඩ ටෙන්ඩර් කිරීමට විරුද්ධ බව ද පැවසීය.

ගරු සභාපතිතුමා, මාළු කඩ සඳහා අදහස් දෙකක් ඉදිරිපත් වී ඇති බැවින් නගර සභා සීමාව තුළ පමණක් සීමා වී ටෙන්ඩර් කරන්නේ ද නැද්ද යන්න පිළිබඳව බෙදීමකට යාමට යෝජනා කරන බව පැවසීය.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් නගර සභාවේ පවතින වෙළඳ බලපත්‍රවල කාලයන් සැලකිල්ලට ගෙන කටයුතු කළ හැකි බව පවසන ලදී.

ගරු සභාපතිතුමා නැවතත් අදහස් දක්වමින් ටෙන්ඩර් කිරීමේ දී පුවත්පත් දැන්වීම් පළ කරන අතර, එහි කොන්දේසි ඇතුලත් කරන බැවින් එම කොන්දේසි අනුව අයදුම්පත්‍ර ලබා ගන්නා බව ද බළන්ගොඩ නගර සභාවේ මාළු වෙළඳාම සම්බන්ධව මීට කලින් බලපත්‍රලාභී ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් ලබා ගැනීමට අයිතිය තිබෙන බව ද එහි අවසාන තීරණය ටෙන්ඩර් මණ්ඩලය සතු බව ද පැවසීය.

ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා පැවසුවේ ටෙන්ඩර් කිරීමේ දී පවතින නීති රෙගුලාසි අනුව කටයුතු කල යුතු අතර, එසේ නොමැති වුවහොත් නඩුවලට යා හැකි බවයි.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් Back List අයට ටෙන්ඩර් සඳහා ඉදිරිපත් වීමට නොහැකි බව සඳහන් කළ යුතු අතර එසේ නොවුනහොත් එම අය විසින් මුදල් යොදවා සියලු කඩ ලබා ගැනීමට හැකි බව පවසන ලදී.

අනතුරුව ගරු උප සභාපති එම්.ටී.එම් රුමී මැතිතුමා අංක 09 හා 10 හැර ඉතිරි කඩ කාමර ටෙන්ඩර් කිරීම සඳහා වන යෝජනාවට බෙදීමක් ඉල්ලා සිටි අතර, ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා ඕනෑම මන්ත්‍රීවරයෙකුට බෙදීමක් ඉල්ලීම සඳහා අයිතියක් පවතින බව ද ඒ සඳහා යෝජනා ස්ථිර කිරීමක් අවශ්‍ය නොවන බව ද කිසියම් මන්ත්‍රීවරයෙකු බෙදීමක් ඉල්ලා එය ලබා නොදුනහොත් සතියක් ඇතුලත කොමසාරිස්තුමාට පැමිණිලි කළ හැකි බව ද මේ සම්බන්ධව පනතෙහි සඳහන් බව ද පැවසීය.

අනතුරුව ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද, රහස් ඡන්දයක්ද යන්න යෝජනා ස්ථිර කර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහි දී විවෘත ඡන්දයකට යාම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ අනුව යෝජනා අංක 06:01:24 පොදු වෙළඳසැල අංක 09 හා 10 හැර ඉතිරි මාළු කඩ ටෙන්ඩර් කිරීම සඳහා වන යෝජනාවට පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම් වෙත දැනුම් දෙන ලදී.

එහිදී 06:01:24 පොදු වෙළඳසැල අංක 09 හා 10 හැර ඉතිරි මාළු කඩ ටෙන්ඩර් කිරීම සඳහා වන යෝජනාවට පක්ෂව ගරු සභිකවරුන් දහතුන් දෙනෙකු ද, එනම්,

| | |
|---|---|
| 01. ගරු සභාපති | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 02. ගරු උප සභාපති | එම්. ටී. එම්. රුමී මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 06. ගරු නාගරික මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |

07. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා

08. ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා

09. ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය

10. ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා

11. ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා

12. ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය

13. ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ද

ඒ සඳහා විපක්ෂව ගරු සභිකවරුන් එක් අයෙකුද, එනම්,

01. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා ද

ඡන්දය ප්‍රකාශ කළ අතර,ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය සහ ගරු නාගරික මන්ත්‍රිනී ශාන්තිලේඛා මැතිතුමිය සභාවට නොපැමිණි ගරු සභිකයින් වේ.

ඒ අනුව 06:01:24 පොදු වෙළඳසැල අංක 09 හා 10 හැර ඉතිරි මාළු කඩ ටෙන්ඩර් කිරීමේ යෝජනාවට පක්ෂව ඡන්ද 13 ක් ද විපක්ෂව ඡන්ද 01 ක් ද වශයෙන් වැඩි ඡන්ද දොළහකින් සභා සම්මත විය.

මෙහි දී ගරු සභාපතිතුමා, ටෙන්ඩර් කිරීම සඳහා අවශ්‍ය කොන්දේසි පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් සමඟ සාකච්ඡා කර, පුවත්පත් දැන්වීමට එම කොන්දේසි ඇතුලත් කරන ලෙස ලේකම්තුමියට උපදෙස් ලබා දෙන ලදී.

06:01:25 2022-03-04 දින විශ්‍රාම යාමට නියමිත එස්.ආර්.වනිගසූරිය මහතාගේ කොන්ත්‍රාත් සේවා කාලය ස්ථිර සේවා කාලයට එකතු කිරීම සඳහා සේවක අර්ථසාධක අරමුදලෙන් සමුච්චිත අරමුදලෙහි තැන්පත් කළ 60% ක ප්‍රමාණය වන රු. 87,363.85ක මුදල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:26 බළන්ගොඩ නගර සභාව මඟින් 2018/2019, 2019/2020, 2020/2021 අධ්‍යයන වර්ෂ සඳහා විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ලබා ගැනීමට අයදුම්පත්‍ර භාර දුන් ශිෂ්‍යත්වලාභීන්ගේ සංශෝධිත නාම ලේඛනය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

| අනු අංකය | නම | ලිපිනය | අධ්‍යන වර්ෂය | විශ්ව විද්‍යාලය | පාඨමාලාව |
|---|---|---|---|---|---|
| 01 | එම්.එම්.පූර්ණි සංදීපා කුලරත්න | අංක 77, කුමාරගම, බලංගොඩ | 2019/2020 | රජරට විශ්ව විද්‍යාලය | ව්‍යවහාරික විද්‍යාව |
| 02 | ආර්. එම්. එස්.මධුෂානි රත්නායක | මස්සැන්න පාර, බෝම්බුව,බලංගොඩ | 2018/ 2019 | කොළඹ විශ්ව විද්‍යාලය | ජෛව පද්ධති තාක්ෂණය |
| 03 | ඒ. අයි. ෆාතිමා නිශ්රා | 91/බී, මිරිස්වත්ත, බලංගොඩ | 2019/2020 | අග්නිදිග විශ්ව විද්‍යාලය | ඉස්ලාම් අධ්‍යයනය |
| 04 | බී.බී.එස්. රශ්මික මධුරංග | නො.35, පරගහකුඹුර, බෝම්බුව, බලංගොඩ | 2019/2020 | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | කළමණාකරණය |
| 05 | ඩබ්. සී. පාරින්දන ගුණරත්න | අරුණ, අනඳමෙත්ගම, පාර, කිරිදිගල, බලංගොඩ | 2019/2020 | ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය | තේ තාක්ෂණය |
| 06 | ඩී.ජී.ඩී.ඉමාෂි උදයංජලී සමරජීව | 151/බී/4, පිරිවෙන පාර, මිරිස්වත්ත බලංගොඩ | 2019/2020 | කැළණිය විශ්ව විද්‍යාලය | කළමණාකරණය |
| 07 | ඩී.එල්.එම්. බණ්ඩාර | නො.23/7, මුගුණමලේ පාර, බලංගොඩ | 2019/2020 | පේරාදෙණිය විශ්ව විද්‍යාලය | විද්‍යා |
| 08 | ඩබ්. ජී.ජී. කෞෂික සමරසුන්දර | බණ්ඩාරවත්ත, මුගුණමලය, බලංගොඩ | 2019/2020 | සබරගමුව විශ්ව විද්‍යාලය | ඉංජිනේරු |
| 09 | මොහොමඩ් යාසීන් සජිත් | නො.49/3, තලාව පාර, දෙහිගස්තලාව, බලංගොඩ | 2018/ 2019 | කැළණිය විශ්ව විද්‍යාලය | පරිගණක තාක්ෂණය |
| 10 | ඩබ්. එම්. නෙත්මි පබසරා දිසානායක | 271/ඩී/16, රණවින්න ගම,කෝපිවත්ත පාර, තුඹගොඩ, බලංගොඩ | 2020/ 2021 | කැළණිය විශ්ව විද්‍යාලය | කලා |
| 11 | එල්.ඒ. සඳලි චාරුකා ලියනආරච්චි | නො.10 බී, සරස්වතී පාර, දෙහිගස්තලාව, බලංගොඩ | 2018/ 2019 | කැළණිය විශ්ව විද්‍යාලය | පරිගණක තාක්ෂණය |
| 12 | ජී. ඊ. ඉසුරි උපාද්‍යා රත්නසේන | නො.15 ඒ/4, කරදියමුල්ල පාර, ඕළුගංතොට, බලංගොඩ | 2020/ 2021 | යාපනය විශ්ව විද්‍යාලය | ඉංජිනේරු |
| 13 | ඩබ්. එල්. චින්තන ජාලිය තිලකරත්න | 32/16,ගම ගෙදර පාර, ඕළුගංතොට, බලංගොඩ | 2020/2021 | ගම්පහ වික්‍රමාරච්චි විශ්ව විද්‍යාලය | සංචාරක කළමණාකරනය |
| 14 | ඩබ්. චමල්කා චිත්‍රමාලි සමරසුන්දර | බණ්ඩාරවත්ත, මුගුණමලේ, බලංගොඩ | 2020/ 2021 | රජරට විශ්ව විද්‍යාලය | කළමණාකරනය |
| 15 | ආර්. ගයාරාම්‍ය ලියනගේ | නො. 252/2 , සුසිරි, බුළත්ගම, බලංගොඩ | 2018/ 2019 | කොළඹ විශ්ව විද්‍යාලය | ශාස්ත්‍ර පීඨය |
| 16 | එම්.එම්.මුෂ්තාක් අහමඩ් | නො. 400 /2 ඒ, දෙහිගස්තලාව , | 2020/ 2021 | අග්නිදිග විශ්ව විද්‍යාලය | තොරතුරු සන්නිවේදන |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | බලංගොඩ | | | තාක්ෂනය |
| 17 | පී.රශ්මික නවීන් | 45/ 2ඒ, තොසිල ගාර්ඩ්න්, කිරිදිගල, බලංගොඩ | 2020/2021 | වව්නියා විශ්වවිද්‍යාලය | තොරතුරු සන්නිවේදන තාක්ෂනය |
| 18 | එච්. චාමික දිනන්දන් සරත්චන්ද් | 150/බී, පිරිවෙන පාර, කුමාරගම, බලංගොඩ | 2018/ 2019 | සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය | දෘශ්‍ය කලා |
| 19 | කේ.ශෂිකා ලක්ෂානි කලුආරච්චි | නො. 41 /1 , සරස්වතී පාර,උඩ ඇල්ලෙපොළ, බලංගොඩ | 2020/ 2021 | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | කළමණාකරනය |
| 20 | එම්.කේ.එම්.විමලසිරි | 390, වතුකාරගොඩ බලංගොඩ | 2018/ 2019 | වයඹ විශ්වවිද්‍යාලය | කළමණාකරනය |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:27 "බණ්ඩාරකුඹුර, උයන්ගහවත්ත, මහ උයන්වත්ත" නැමැති ඉඩම අත්පත් කර ගැනීමට හා ඒ සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් සඳහන් කර ඇති තාවකාලික තක්සේරු මුදල වන රු. 1,250,000.00 ක මුදල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:28 කුමාරගම වසමේ අංක 620071 කැඩැස්තර සිතියමේ කලාප 12 හි කැබලි අංක 131 වන හපුගහහේන ඉඩම සහ තුඹගොඩ වසමේ අංක 620077 දරණ කැඩැස්තර සිතියමේ කලාප 08 හි කැබලි අංක 118 වන බෝගහහේන ඉඩම යන ඉඩම් කොටස් නගර සභාව වෙත පවරා ගැනීම සඳහා අවශ්‍ය පිඹුරු (බිම් කට්ටි සැලසුම්) සකසා ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:29 2022 වර්ෂයේ මහ සභාව සෑම මසකම දෙවන අඟහරුවාදා පැවැත්වෙන අතර, පහත සඳහන් දිනයන් නිවාඩු දිනයන් වන බැවින් එම මාසයට අදාල මහ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- අප්‍රේල් 12

- ජූනි 14

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව අප්‍රේල් මස පැවැත්වීමට නියමිත මාසික මහ සභාව අප්‍රේල් මස 06 වන දින හා ජූනි මස පැවැත්වීමට නියමිත මාසික මහ සභාව ජූනි මස 07 වන දින පැවැත්වීම සුදුසු බවට ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:30 බලංගොඩ නගර සභා තානායම ටෙන්ඩර් කිරීමට පෙර අළුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනිම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:31 බළන්ගොඩ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ටයිල් ඇතිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:32 බළන්ගොඩ ළමා උද්‍යානය නවීකරණය කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී.එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලෙස්න මැතිතුමා, මෙහි නවීකරණය කරන්නේ කුමක්ද යන්න විමසන ලදී.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් විය යුත්තේ කුමක් දැයි එම ස්ථානයට පැමිණ සිටි අයගෙන් තමන් විමසූ බව ද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාට යෝජනා ඉදිරිපත් කරන ලෙස පැවසූ අවස්ථාවේ දී ළමා උද්‍යානයට අලංකාර ලෙස ආලෝකකරණය ලබා දීම හා වැසිකිළි පහසුකම් සලසා දීමට යෝජනා වූ බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් මෙම යෝජනා පසුගිය කාලයේ දී සාකච්ඡා කළ අතර, ලක්ෂ 16 ක පමණ මුදලක් වැසිකිළි පද්ධතියක් ඉදි කිරීම වෙනුවෙන් ලැබීමට නියමිත වී තිබුණු නමුත් ඒ සියල්ල ගරු නාගරික මන්ත්‍රීවරුන් පිරිසක් විසින් නතර කළ බව ද

එය එම කාලයේ ඉටු කළේ නම් සභාවේ මුදල් ඉතිරි වන බව ද තමන් පැවසුවේ නවීකරණය නොකරන ලෙස නොවන බව ද පැවසීය.

ගරු සභාපතිතුමා පැවසුවේ වැසිකිළි පද්ධතිය එම ස්ථානය ඇතුලත ඉදිකළ යුතු අතර, වෙනත් ස්ථානයකට ජනතාව යාමට අකමැති බවයි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා අදහස් දක්වමින් ළමා උද්‍යානය නවීකරණය සම්බන්ධයෙන් සතුටට පත් වන බව ද ඇවිදින මංතීරුව ආශ්‍රිතව ඇතැම් පුද්ගලයන් මත්පැන් ලබා ගන්නා බව දක්නට ලැබෙන බැවින් ඒ සඳහා විශේෂ අවධානයක් යොමු කර, දැන්වීමක් හෝ යොදන ලෙස පැවසීය.

ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා පවසා සිටියේ ගරු සභාපතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පොලිසිය සමග මේ සම්බන්ධව සාකච්ඡා කළ අතර විශේෂයෙන් පොලිසිය මඟින් ජංගම සේවාවක් කරන්නේ නම් දැන්වීම් යොදනවාට වඩා එය ඵලදායී වන බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:33 බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය පහත සඳහන් සංවර්ධන කටයුතු වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

i. වැසි ජල කාණුව සකස් කිරීම
ii. දාහක උදුනක් සකස් කිරීම
iii. Chopping Machine එකක් මිලදී ගැනීම
iv. High Presure gun උපකරණයක් මිලදී ගැනීම
v. Bale Machine එකක් මිල දී ගැනීම
vi. වහලය අලුත්වැඩියා කිරීම (විනිවිද පෙනෙන තහඩු)
vii. Grease Gun මිලදී ගැනීම
viii. හලර් යන්ත්‍රයේ දූල අලුත්වැඩියා කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:34 බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා සේවකයන් 03 දෙනෙකුගේ සේවය මිලට ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:35 තුරු උයන සඳහා ආපන ශාලාවක් සහ දැකුම්කළු වැසිකිළි පද්ධතියක් සකස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් තුරු උයන සඳහා ලක්ෂ 68 ක් පමණ වන අංග සම්පූර්ණ වැසිකිළි පද්ධතියක් ලැබීමට නියමිතව තිබූ නමුත් එය නවතා දැමූ බව ද අදාල අය සමග කතා කළ අවස්ථාවේ දී දේශපාලන ප්‍රශ්නයක් පවතින බැවින් නවතා ඇති බවට තොරතුරු ලැබුණු බව ද මෙය එම අවස්ථාවේ දී ඉටු කළේ නම් සභා අරමුදල් ඉතිරි කර ගැනීමට හැකිව තිබූ බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා, දේශපාලන අර්බුද නිර්මාණය වූ පසු එසේ සිදුවන අතර, මේ වන විට එම අර්බුද නිමා වී ඇති බැවින් සියලු දෙනා සමග වැඩ කටයුතු කිරීමට හැකි බව ද ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා එකඟ නම් වඩා හොඳ බව ද එකඟ නොවුනත් මෙය ඉටු කරන බව ද ලැබුණු ව්‍යාපෘති නවතා දැමුවේ කවුදැයි නොදන්නා බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් තුරු උයන සංකල්පය අනුව ව්‍යපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ගස් ඉවත් කරන්නේ නම් එම සංකල්පයෙන් පවා තේරුමක් නොමැති බව ද ගස්වලට හානියක් නොවන පරිදි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලෙස පැවසීය.

මෙහි දී ගරු සභාපතිතුමා පැවසූවේ අදාල ගෘහ නිර්මාණ ශිල්පියා සමග සම්බන්ධ වී සුදුසු පරිදි අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත්, ගස් ඉවත් කිරීමක් සිදු නොවන බවත් ය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:36 බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිවරයාගේ නිල රථය වන PF 4006 කැබ් රථය සඳහා රියදුරකු වශයෙන් කේ.එල්.එස්.පී. විජේරත්න යන අයව දෛනික වැටුප් ගෙවීමේ පදනම මත සේවයේ යොදවා ගැනීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:37 බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිවරයා සඳහා පෞද්ගලික ලේකම් වශයෙන් ඩබ්.ජී. නිෂාදි සංජුලා මෙනවිය බඳවා ගැනීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:38 බළන්ගොඩ නගර සභා පෙර පාසල් ගොඩනැගිල්ල සඳහා ආරක්ෂක දැලක් සකස් කිරීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:39 මාධ්‍යවේදී දීමනාව රු.250.00 කින් වැඩි කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:40 අංක 09 හා 10 දරණ මාළු කඩ කාමර නීති කෘත්‍යය සඳහා චන්ද්‍රානි දයාරත්න යන අය තෝරා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනිම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:41 2022 වර්ෂය සඳහා සාමාජික මුදල් වශයෙන් රු.25,000.00 ක මුදලක් ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:42 බළන්ගොඩ, වෙට්නෝල් පාර, පළමු පටුමග යන ස්ථානයට ජල නල එලීම සඳහා මාර්ගය පළුදු කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අවසර ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:43 2022 වර්ෂය සඳහා රථ වාහන ටෙන්ඩරය ලබා ගත් කාල්දීන් චාලට් යන අය එම ටෙන්ඩරය කර ගෙන යාමට නොහැකි බව දන්වා ඇති බැවින් සුදුසු බදුකරුවෙකු තෝරා ගැනීම සඳහා නැවත ටෙන්ඩර් කිරීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම හා අවම ලංසු මුදල තීරණය කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා මේ සම්බන්ධව අදහස් දක්වමින් ගිවිසුමේ දහ නවය වගන්තියෙහි ටෙන්ඩරය සිදු කරගෙන යාමට නොහැකි නම් නැවත බාර දීමට හැකි බව සඳහන්ව ඇති බව ද නැවත ටෙන්ඩර් කිරීමට වැයවන මුදල සභාවෙන් දැරිය නොහැකි අතර, එම මුදල අදාල ටෙන්ඩර්කරුගෙන් අයකර ගත යුතු බව ද රුපියල් 184,000.00ක මුදලකට ටෙන්ඩරය ලබා දුන් නමුත් අයවන්නේ රු. 130,000.00 ක් වැනි මුදලක් බැවින් ටෙන්ඩර් කිරීමට අවම ලංසුව තීරණය කළ යුතු බව ද පවසන ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පැවසුවේ මෙම මුදල් අය නොවීමට හේතු පවතින අතර, 25% ක් දෙනා මුදල් ලබා නොදෙන බවත්, මුදල් එකතු කරන අය හට හිරිහැර කරන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් රථවාහන නැවැත්වීමට නිසි ස්ථාන නොමැති වීම නිසා මෙවැනි ගැටලු ඇතිවන බව පැවසීය.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා පැවසුවේ තමන් පසුගිය සභාවක දී වාහන නවතා තැබීම සඳහා අක්කර 01 ක පමණ ඉඩමක් ලබා ගැනීමට සූදානම් වූ බවයි.

අනතුරුව ගරු සභාපතිතුමා, ටෙන්ඩර් කිරීමට අවශ්‍ය අවම ලංසු මුදල තීරණය කරන ලෙස පැවසීය.

මෙහි දී ගරු උප සභාපති එම්.ටී.එම්. රුමී මැතිතුමා, රථ වාහන ටෙන්ඩරය සඳහා සුදුසු බදුකරුවෙකු තෝරා ගැනීම වෙනුවෙන් නැවත ටෙන්ඩර් කිරීමටත්, අවම ලංසු මුදල වශයෙන් රුපියල් ලක්ෂයක් (රු. 100,000.00) සුදුසු බවටත් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:44 ND 5124 වැන් රථයේ වායු සමීකරණ පද්ධතිය පූර්ණ සේවා කිරීම හා බ්‍රේක් බැලන්ස් පද්ධතිය යොදා අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:45 RE 2600 ට්‍රැක්ටර් රථයේ ක්ලච් පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:46 ZA 5039 ජේසීබී යන්ත්‍රයේ පහත අලුත්වැඩියාවන් සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

- බ්‍රේක් ඔයිල් අඩුවන බැවින් පරීක්ෂා කර, අලුත්වැඩියා කිරීම
- ඉන්ජෙක්ටර් පොම්පය අසලින් ඩීසල් කාන්දු වන බැවින් එය අලුත්වැඩියා කිරීම
- පසුපස බකට් එක අලුත්වැඩියා කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:47 පොදු වෙළඳසැල අංක 16 ගව මස් කඩ කාමරයට අදාලව 2021 වර්ෂයේ කඩ කුලිය ලෙස රු. 325,161.29 ක් වැඩිපුර අය වී ඇති අතර, එම මුදල එම්.එම්. නජීම් යන අය වෙත ලබා දීමට සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:48 2021 ඔක්තෝම්බර්, නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහා විශ්‍රාම වැටුප් දායක මුදල වශයෙන් රු. 36,530.91ක් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:49 2022 වර්ෂයේ කර්මාන්ත අංශය සඳහා දෛනිකව කම්කරුවන් 15 කගේ සේවය ලබා ගැනීමට සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:50 2022 වර්ෂයේ සෞඛ්‍ය අංශය සඳහා දෛනිකව කම්කරුවන් 25 කගේ සේවය ලබා ගැනීමට සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:51 2022 වර්ෂය සඳහා ජල බිල්පත්, විදුලි බිල්පත්, දුරකතන බිල්පත්, ඉන්ධන, දෛනික වැටුප්, සේවක ණය, අතිකාල හා ගමන් වියදම්, සංග්‍රහ වියදම්, පෙර පාසල්, සුසාන භූමි,සභික දීමනාව, සෞඛ්‍ය සේවා වියදම්, රැඳවුම් ගාස්තු, පුවත්පත් ගාස්තු, හදිසි වාහන හා යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කටයුතු හා කාර්යසාධන ණය සභාවේ/මුදල් කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:52 නාගරික සංවර්ධන නිවාස ව්‍යාපෘතිය යටතේ වැසි ජල කාණු පද්ධතිය ඉදි කිරීම වෙනුවෙන් සහ නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය යටතේ නව බස්නැවතුම්පොළ සහිත වෙළඳ සංකීර්ණය ඉදි කිරීම වෙනුවෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබා ගත් ණය මුදල් සඳහා ණය වාරික වශයෙන් මසකට රු. 972,599.20 ක් බැගින් 2022 වර්ෂයේ සෑම මසකම ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:53 කෝබ්රා ලයිට් සඳහා අවශ්‍ය 3 Cor 15 A Wire මීටර 100 ක් මිල දී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:54 නගර අලංකරණය සඳහා ඇති මල් පෝච්චි සහ ළමා උද්‍යානය වටරවුම් අලංකරණය සඳහා අවශ්‍ය පොහොර හා ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:55 කාර්යාලයට අවශ්‍ය ජෙනරේටරයක් මිල දී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:56 ළමා උද්‍යානය අලංකරණය කිරීම, බෝඩ් සැකසීම හා අවශ්‍ය විදුලි අයිතම ඇස්තමේන්තුව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- PVC Pipe ½ - 65
- T Shocket ½ - 200
- L Bore ½ - 200
- Bend ½ - 40
- 1.044 Wire Broun - 05
- 1.044 Wire Blue - 05
- S-lon Blue 500g - 03
- Flood Light 3 W - LED 140
- Globe Light - 3 unit 04
- Spot light (Warm) - 10W 24

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:57 LL7688 ෆෝටෝන් කෘෂ කැබ් රථයේ ක්ලච් රේසර්, ක්ලච් ප්ලේට් දැමීම හා ඩීසල් මීටරය අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:58 226-7521 ටිපර් රථයේ සිසිලන පද්ධතිය, ප්‍රධාන ආලෝක පද්ධතිය, පවර් ස්ටීරියන් බොක්ස් එක, බ්‍රේක් පද්ධතිය ඇතුළු දකුණු පස කණ්නාඩිය දැමීම හා ටිපර් ජැක් එක අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:59 ටෙන්ඩර් කර ඇති දැන්වීම් පුවරු 09 ක් අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් මෙම දැන්වීම් පුවරු ශක්තිමත්ව ආකර්ශනයක් ඇති වන පරිදි අලුත්වැඩියා කිරීමට ක්‍රමවේදයක් මීට පෙර අවස්ථාවක දී සකස් කළ බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:60 2022 වර්ෂයේ නිල ඇඳුම් දීමනාව ලබා ගැනීම සඳහා අයදුම් කර ඇති සේවකයන් 27 දෙනෙකුට රු. 4,000.00 බැගින් ලබා දීම හා ආයුර්වේද වෛද්‍ය නිළධාරී/කාර්මික නිළධාරීන්/සෞඛ්‍ය පරිපාලක/වැඩ පරිපාලක/පොදු වෙළඳසැල් භාරකරු යන අය හට නිළ ඇඳුම් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:61 ක්ෂේත්‍රයේ රාජකාරිවල නියැලෙන නිළධාරීන් හා ක්ෂේත්‍ර පරීක්ෂාවේ යෙදෙන අය වෙනුවෙන් ආරක්ෂිත හිස්වැසුම් සහ ආරක්ෂිත ජැකට් කට්ටල 10 බැගින් මිලදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:62 2021 භාණ්ඩ සමීක්ෂණ වෙන්දේසි හා අපහරණ කමිටුව පත් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | එස්.එච්.ඒ.කරුණාරත්න මිය | ලේකම් |
| 02 | එම්.ඩී.එස්.ප්‍රනාන්දු මයා | ගණකාධිකාරී |
| 03 | ජී.ඩී.ඒ.සේමපාල මිය | ප්‍රධාන කළමනාකරණ සහකාර |
| 04 | ජේ.සී.මධුරංග විජේපාල | විමර්ශන නිළධාරී |
| 05 | සිසිර සේනාධීර මයා | වැඩ අධිකාරී |
| 06 | සී.පී. එම්. මාණිපුර මයා | තාක්ෂණ නිලධාරී |
| 07 | රජිත කොස්වත්ත මයා | සංවර්ධන නිළධාරී |
| 08 | එන්.සී.කාමිලා මිය | කළමනාකරණ සේවා නිළධාරී |
| 09 | රසිකා සෙව්වන්දි ගුණසේකර මිය | සංවර්ධන නිළධාරී |

| | | |
|---|---|---|
| 10 | තක්ෂිලා අබේසිංහ | සංවර්ධන නිළධාරී |
| 11 | ඉදුනිල් ප්‍රියන්ත මයා | සංවර්ධන නිළධාරී |
| 12 | ෂැලෝම් ඒන්ජල් වාස් මිය | කළමනාකරණ සේවා නිළධාරි |
| 13 | අමිල ලක්මාල් මයා | සංවර්ධන නිළධාරී |
| 14 | ඩබ්.එස්.මෙනේරිවත්ත මිය | කළමනාකරණ සේවා නිළධාරි |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

2021 භාණ්ඩ සමීක්ෂණ වෙන්දේසි හා අපහරණ කමිටුව සඳහා ඉහත සඳහන් නිළධාරී මණ්ඩලයට අමතරව ගරු නාගරික මන්ත්‍රීනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය, ගරු නාගරික මන්ත්‍රී ජී. චන්ද්‍රලතා මැතිතුමිය හා ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:63 2022-2026 ඒකාබද්ධ උපාය මාර්ගික සංවර්ධන සැලැස්ම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:64 පුස්තකාලය සඳහා ආදේශක පුස්තකාල සහායිකාවක් බඳවා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා, පුස්තකාලය සඳහා බඳවා ගන්නේ කවුද යන්න සහ තිබිය යුතු සුදුසුකම් මොනවාද යන්න විමසීය.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් ආදේශක පුස්තකාල සහායිකා තනතුර සඳහා විෂයයන් 06 ක් සමත්විය යුතු අතර, සම්මාන සාමාර්ථ 02 ක් ලබා තිබිය යුතු බව ද මේ වන විට අයදුම්පත් 25 ක් පමණ ලැබී ඇති බව ද දේශපාලන ජීවිතයේ අවුරුදු 27 ක කාලය තුළ තමන් කිසිදු අයෙකු රැකියාවකට යොදා නැති බව ද තමන්ට ද කෙනෙකු යෙදවීමට අයිතියක් පවතින නමුත් එසේ නොකරන බව ද මීට පෙර එවැනි දේ සිදු වූ අතර, එම ක්‍රමය වෙනස් කරන බව ද පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:65 බළන්ගොඩ, JF ස්ථානයේ රිය අනතුරක් නිසා ගුණපාල යන අය හා ඔහුගේ බිරිඳගේ පාද දෙකම අහිමි වී ඇති බැවින් ඒ සම්බන්ධව සානුකම්පිතව බලා ඔවුනගේ ඉල්ලීම මත වැසිකිළියක් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා, ගුණපාල යනු කවරෙක්දැයි විමසන ලදී.

මේ සඳහා පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, ගුණපාල යන අය කිවුලවෙල ප්‍රදේශයේ පුද්ගලයෙකු බවද ඔහු සහ බිරිඳ රිය අනතුර හේතුවෙන් පාද අහිමිව ජීවත්වන අතර, වැසිකිළි පහසුකම් සලසා දෙන ලෙස දිගින් දිගටම ඉල්ලීම් ලිපි එවූ බව ද මේ සම්බන්ධව ස්ථානීය පරීක්ෂණයක් සිදු කළ අතර, 2022 අයවැය මගින් සෞඛ්‍ය අංශයට වෙන් කළ මුදලින් වැසිකිළියක් ලබා දීමට සහා අනුමැතියට යොමු කළ බව ද පැවසීය.

මේ සම්බන්ධව අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා, වැසිකිළි ආධාර සඳහා වෙන් වූ මුදලින් ලබා දීම සුදුසු බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:66 ගිණුම් අංශයට අවශ්‍ය පහත සඳහන් කාර්යාල උපකරණ ලබා ගැනීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

- මේස - 02
- පුටු - 03
- පරිගණක - 02

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:67 කිවුලවෙල පන්සල මාර්ගය සංවර්ධනය කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා, මේ සඳහා ප්‍රතිපාදන වෙන් කර ගන්නේ කෙසේදැයි විමසීය.

මේ සම්බන්ධව පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, තම කොට්ඨාසයේ සංවර්ධන කටයුතු සිදු නොවූ අතර, ඒ පිළිබඳව සම්බන්ධීකරණ කමිටුවේ දී හා හිටපු ගරු සභාපතිතුමා සමඟ කතා කළ බව ද තමන්ට අසාධාරණයක් සිදු වූ බව ද රජයෙන් වෙන් වූ මුදල් පවා තමන්ට නොලැබුණු බැවින් තම කොට්ඨාසය සංවර්ධනය වෙනුවෙන් වැඩි අවධානයක් යොමු කරන බව ද කොම්පෝස්ට් ව්‍යාපෘතිය 100% ක් වෙනස් කිරීමට සිදු වන අතර, එම මාර්ගයට බස් රථයක් අවශ්‍ය බවට ඉල්ලීම් පවතින බැවින්

එය ඉටු කළ යුතු බව ද ඒ සඳහා මාර්ගය නඩත්තු කර සංවර්ධනය කිරීමට සිදු වන බව ද බැංකියවත්ත ප්‍රදේශය පරිසරයේ ආශ්වාදයන් විඳීමට හැකි වන ලෙස සුන්දර පරිසරයක් බවට පරිවර්තනය කළ යුතු අතර, ඒ සඳහා කෝටි ගණනක යන්ත්‍රෝපකරණ ඇතුළු විශාල මුදලක් යෙදවීමට අපේක්ෂා කරන බව ද දඹුල්ල නගර සභාවේ කොම්පෝස්ට් ව්‍යාපෘතිය නැරඹීමට කාර්ය මණ්ඩලයේ කිහිපදෙනෙකු සමඟ යාමට බලාපොරොත්තු වන බැවින් එදිනට ගරු නාගරික මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වය ලබා දෙන ලෙස ද පවසන ලදී.

එමෙන්ම අයවැය මඟින් නඩත්තු අලුත්වැඩියා සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන මඟින් මෙය ඉටු කරන බව ද සියලුම දෙනා අයවැය ලේඛනය පරිශීලනය කර, පවතින මුදල අනුව යෝජනා සභා අනුමැතියට යොමු කර අවශ්‍ය කටයුතු සිදු කර ගන්නා ලෙස වැඩිදුරටත් පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:68 අංක 16 දරණ එළ හරක් මස් කඩ කාමරය වෙනුවෙන් ජේ.එම්. නව්ෂාන් හා එෆ්.එම්. රවුෂාන් යන අය විසින් තැන්පත් කර ඇති රුපියල් ලක්ෂය බැගින් වූ තැන්පත් මුදල් ආපසු අදාල අය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:69 රට තුළ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් මහජනයා නගරයට නොපැමිණීම නිසා 2021 අගෝස්තු හා සැප්තැම්බර් යන මාස දෙක සඳහා මාසික කුලිය ගෙවීමට නොහැකි බව අදාල ටෙන්ඩර්කරු විසින් දන්වා ඇති බැවින් එම මාස දෙක සඳහා පොදු වැසිකිළි මාසික කුලිය අය නොකර සිටීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2021 අගෝස්තු හා සැප්තැම්බර් මාස දෙක සඳහා පොදු වැසිකිළි මාසික කුලිය අය නොකිරීම සුදුසු බැවින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කර අනුමැතිය අනුව ඉදිරි කටයුතු කිරීම සුදුසු බව පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:70 බළන්ගොඩ නගර සභා මහජන පුස්තකාලයේ මාස දෙකක පුහුණුවක් ලබා ගැනීම සඳහා සපර්දීන් ෆාතිමා රිස්මා හා මොහොමඩ් සාදික් ෆාතිමා පස්නා යන අය අවසර ඉල්ලා ඇති අතර, ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:71 බැංකියවත්ත එපිටපැත්ත මාර්ගය නඩත්තු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:72 අංක 16 දරණ එළ හරක් මස් කඩය මහජන සෞඛ්‍ය පරීක්ෂක වැඩ වර්ජනය නිසා 2022-02-07 දින සිට වසා ඇති බැවින් මෙම වර්ජනය පවතින දිනයන් සඳහා කුලිය අඩු කිරීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව මහජන සෞඛ්‍ය පරීක්ෂක වැඩ වර්ජනය පවතින දින සඳහා කුලිය අය නොකිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. මිල ගණන් අනුමත කිරීම හා මුදල් ගෙවීම**

07:01 බොබ් කැට් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා නියෝජිත ආයතනය වන C-COM Equipment PVT Limited වෙතින් ඉදිරිපත් කර ඇති රු. 955,829.16 ක ඇස්තමේන්තුව අනුමත කර අදාල සේවාව ලබා ගැනීම හා මුදල් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම (30/2016 රජයේ වාහන නඩත්තු කිරීම චක්‍රලේඛයට අනුව අභ්‍යන්තර අලුත්වැඩියා යටතේ)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:02 ZA 5326 මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය පූර්ණ සේවා කිරීම සඳහා එම යන්ත්‍ර සේවා කිරීමේ නියෝජිත ආයතනයක් වන ඇවන්ස්මාර්ට් ඉංජිනියරින් ආයතනය වෙතින් ඉදිරිපත් කර ඇති රු. 287,800.08 ක ඇස්තමේන්තුව අනුමත කර අදාල සේවාව ලබා ගැනීම හා මුදල් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:03 පිළිගැනීමේ කවුළුවේ තිබෙන Q 16377 ඡායා පිටපත් යන්ත්‍රය සඳහා Wisdom Computer Technologies ආයතනයෙන් එකක් රු. 11,350.00 බැගින් Mp 2014 HS Toner පහක් මිල දී ගැනීම සඳහා රු. 56,750.00 ක මුදල අනුමත කර ගැනීම හා මුදල් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:04 සෞඛ්‍ය අංශයේ කසළ එකතු කිරීම සඳහා අත් කරත්ත 05ක් අලුත්වැඩියා කිරීම හා ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය වෙනුවෙන් PMK හාඩ්වෙයාර් වෙතින් ඉදිරිපත් කර ඇති රු. 51,806.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීම හා මුදල් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:05 ZA 5039 ජේසීබී යන්ත්‍රය පූර්ණ සේවා කිරීම සඳහා නියෝජිත ආයතනය වන ඇවන්ස්මාර්ට් ඉංජිනියරින් වෙතින් ඉදිරිපත් කර ඇති රු.71,232.10 ක ඇස්තමේන්තුව අනුමත කර අදාල සේවාව ලබා ගැනීම හා මුදල් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා සභාවේ විශාල ආදායමක් ලබා දෙන යන්ත්‍ර බැවින් පවතින්නා වූ සුළු සුළු කාර්මික දෝෂ ඉවත් කර භාවිතයට ගන්නා ලෙස ද නැතිනම් මෙය ජාතික අපරාධයක් වන බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසූවේ එම කටයුතු සිදුවෙමින් පවතින බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:06 RB 4786 අංක දරණ ට්‍රැක්ටර් රථයේ පහත අලුත්වැඩියා සඳහා තෙබුවන ගරාජය වෙතින් ඉදිරිපත් කර ඇති රු. 77,800.00 ක ඇස්තමේන්තුව අනුමත කර අදාල සේවාව ලබා ගැනීම හා ඒ සඳහා මුදල් ගෙවීමට සභා අනුමැතිය ලබා ගැනීම (30/2016 රජයේ වාහන නඩත්තු කිරීම චක්‍රලේඛයට අනුව අභ්‍යන්තර අලුත්වැඩියා යටතේ)

- ක්ලච් ප්ලේට් - රු. 13,850.00
- ප්‍රෙෂර් ප්ලේට් - රු. 32,500.00
- ක්ලච් රේසර් - රු. 5,300.00
- ප්‍රයිවිල් රේසර් - රු. 950.00
- ප්‍රයිවිල් එක ප්‍රෙස් කිරීම - රු. 4,500.00
- සයිලන්සරය අලුතින් දැමීම - රු. 10,850.00
- වැඩ කුලිය - රු. 9,850.00

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:07 ඇවිදින මංතීරු ව්‍යාපෘතිය සඳහා තුරු උයනේ ලුණුමිදෑල්ල ගස සහ කායා ගස් දෙකක් කපා බිම හෙළීම වෙනුවෙන් අවම මිල ගණන වන රු. 19,500.00 ක මුදල ඉදිරිපත් කර ඇති ටී.එම්. ධර්මරත්න යන අයගෙන් ලැබී ඇති මිළ ගණන අනුමත කර මුදල් ගෙවීමට සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. මන්ත්‍රී යෝජනා**

**08:01 ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා**

08:01:01 කල්තොට පාර, කුමාරගම තුන්වන පටුමග සංවර්ධනය කිරීම

08:01:02 මිරිස්වත්ත, කහටපිටිය මාර්ගය පළමු පටුමග කාණු පද්ධතිය නඩත්තු කිරීම හා දෙවන පටුමග මාර්ගයේ අවසන් කොටස සංවර්ධනය කිරීම

08:01:03 කල්තොට පාර, කහටපිටිය මාර්ගය දෙවන පටුමග පාර මැදින් වතුර ගලා යන බැවින් කාණුව සකස් කිරීම

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:02 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා**

08:02:01 ඉරිදා පොළ පිරිසිදුව පවත්වා ගැනීම

08:02:02 ඉරිදා පොළේ ඇති මාළු කඩ අසල ඇති වැසිකිළිය ඉවත් කිරීම

08:02:03 ඉවතලන ප්ලාස්ටික් පොලිතින් මගින් බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීම සඳහා සාකච්ඡා කර ගැනීම

08:02:04 නගර සභාවේ පුරප්පාඩුව පවතින මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු ලබා ගැනීම

08:02:05 සභාවේ සිටින සේවකයන් නිත්‍ය තනතුරුවල පිහිටුවීම

08:02:06 බළන්ගොඩ තානායම වර්තමාන බදු කරු වන ඉන්දික එරික් සිසිල් යන අයටම තවත් වසර දෙකක් බදු දීම

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් ඉරිදා පොළ අපිරිසිදු තත්ත්වයෙන් පවතින බව ද සඳුදාට අමතරව සෙනසුරාදා දින පොළ පිරිසිදු කරන ලෙස ද කාණු පද්ධතිය පිරිසිදු කරන ලෙස ද පවසන ලදී.

එමෙන්ම පොළ භූමියේ මාළු කඩ අසල ඇති වැසිකිළිය තමන්ගෙන් සිදු වූ වරදක් බව ද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් මෙය ඉවත් කරන ලෙස පවසන බව ද නව ක්‍රම භාවිත කර ඉරිදා පොළේ කෙළවරෙහි දෙපැත්තට වැසිකිළි ඉදි කර මෙය ඉවත් කරන ලෙස ද ගරු සභාපතිතුමා නව තාක්ෂණය අනුව නිළධාරීන්ගෙන් උපදෙස් ලබාගෙන කටයුතු කරන අතර, තමන් සිටි කාලයේ උපදෙස් ලබා දීමට කෙනෙකු නොසිටි බව ද නගරය හදන්න තිබෙන ආසාවට තමන් පැමිණි බව ද පැවසීය.

තවදුරටත් අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ඉවතලන ප්ලාස්ටික් පොලිතින් මගින් බ්ලොක් ගල් නිෂ්පාදනය කරන ව්‍යාපෘති ක්‍රියාත්මක වන බැවින් ණය නොවී එවැනි කටයුත්තකට යොමු වන්නේ නම් වඩා හොඳ බව ද කාර්ය මණ්ඩලය සඳහා පුරප්පාඩුව පවතින මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ද හිටපු මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වා ගනිමින් කටයුතු කළ බව ද නගර සභාව දිනා ගත්තා වූ සියලුම සම්මාන තමන් තනියම නොගත් අතර, නිළධාරී මණ්ඩලයේ කැපවීම බලපෑ බව ද සභා තීරණයක් ගෙන සභා මුදලින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු ලබා ගන්නා ලෙස ද පවසන ලදී.

එමෙන්ම සභාවේ සිටින සේවකයන් නිත්‍ය තනතුරුවල පිහිටුවන ලෙස ද විශේෂයෙන් ඉරිදා පොළේ ආදායමට වඩා වැඩ කරන අය වෙනුවෙන් ගෙවීමට සිදු වන නමුත් වෙළඳපොළ භාරකරු සිටින බව ද මුදල් ගැටලුවක් මත ඔහුට එම කාර්යය නොදී ඇති අතර, එක් නිළධාරියෙක් ඒ සඳහා යොදන ලෙස ද පවසන ලදී.

අනතුරුව බළන්ගොඩ තානායම වර්තමාන බදු කරු වන ඉන්දික එරික් සිසිල් යන අයටම තවත් වසර දෙකක් බදු දීම පිළිබඳව සාකච්ඡා කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් මේ සම්බන්ධව කලින් ලබා ගත් තීන්දු වාර්තා සියල්ල පවතින බව ද වාර්තා පළාත් පාලන කොමසාරිස්තුමාට යොමු කර තිබුණු නමුත් ගරු ආණ්ඩුකාරතුමාට ලැබී නොමැති බව ද අවුරුදු 02 ක් තානායම ලබා දෙනවා ද නැද්ද යන්න සම්බන්ධව තීරණයක් අවශ්‍ය බව ද කොරෝනා වසංගතය හේතුවෙන් වසර 02 ක් තානායම

පවත්වාගෙන යාමට නොහැකි වූ අතර විවාහ උත්සව සඳහා ලබා ගත් මුදල් පවතින බව ද එම උත්සව ඉදිරියේ දී සිදු කිරීමට සිදුවන බැවින් අවුරුදු දෙකක කාලයක් කුලී ගෙවීමේ පදනම මත ලබා දෙන ලෙස ඉල්ලා සිටින බව ද එක් දිනකදීවත් නියමාකාර යෝජනාවක් නොපැමිණි බව ද පැවසීය.

මෙහි දී අදහස් දක්වූ ගරු සභාපතිතුමා පැවසුවේ මෙම අවස්ථාවේ දී යෝජනාවක් වශයෙන් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා විසින් මෙහි දී ගෙන ආ නමුත් ගරු ආණ්ඩුකාරතුමාට ලිඛිත ඉල්ලීමක් කර ලිපියක් ඉදිරිපත් කර නොමැති බවයි.

එමෙන්ම 2022-01-21 දිනැති විශේෂ මහ සභාවේ දී 2022 ජනවාරි මස 31 දිනට පෙර ගරු ආණ්ඩුකාරතුමාගෙන් එරික් සිසිල් යන අයටම ලබා දෙන ලෙස නිර්දේශ කර ලිපියක් ලබා ගන්නා බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා පවසා ඇති බව ද තමන් සහ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා මීට පෙර අවස්ථාවලදී මේ සඳහා උත්සාහ කළ බව ද අද 07 වනදා බැවින් තානායමේ ටෙන්ඩර් ගිවිසුම අවලංගු වූ පසු තානායමේ තීන්ත ආලේප කරන බව ද එම අතරතුර කාලයේ දී හැකි නම් අදාල අනුමැතිය ලබා ගන්නා ලෙස ද පවසන ලදී.

නැවතත් අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා විසින් ගරු ආණ්ඩුකාරතුමා වෙත සභාවේ ලිපියක් ලබා දෙන ලෙසට පැවසූ අතර, මෙම යෝජනාව සඳහා බෙදීමක් ඉල්ලා සිටින බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් බදු කාලය 2022/02/28 දිනෙන් අවසන් වන අතර, ඉදිරි වසර 02 ක් සඳහා දීර්ඝ කරන ලෙස කරන ලද ඉල්ලීම් ලිපියට පිළිතුරක් ලබා දීමට නොහැකි නිසා ඉන්පසු පැවති සභාවට යෝජනාවක් ලෙස ඇතුලත් කළ බව ද බදු කාලය දීර්ඝ කිරීම සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්තුමාට යොමු කර ඇති නමුත් එතුමා තානායම ටෙන්ඩර් කිරීම සුදුසු බව පවසා ඇති බව ද තානායමේ බදු කාලය 2024 දක්වා දීර්ඝ කරන ලෙස ටෙන්ඩර්කරු විසින් මෙහි දී ඉල්ලීමක් කර ඇති බව ද ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා විසින් ද ගරු ආණ්ඩුකාරතුමාගෙන් විමසීමක් කළ අතර, සභා අනුමැතිය ලබා ගෙන ඉදිරිපත් කරන ලෙස එහි දී පවසා ඇති බව ද යෝජනාව පැහැදිලිව ඉදිරිපත් නොවීම නිසා මෙම ගැටලුව ඇති වී ඇති බව ද පවසන ලදී.

ගරු උප සභාපති එම්. ටී.එම්. රූමි මැතිතුමා අදහස් දක්වමින් තවත් අවුරුදු 02 ක් ලබා දීමට කැමැති ද යන්න තීන්දුවක් ලබාගෙන එය ආණ්ඩුකාරතුමාට යොමු කළ යුතු බව පැවසීය.

ගරු සභාපතිතුමා, ඒ සම්බන්ධ මේ මොහොතේ දැනගත් බව ද විවාහ උත්සවවලට අත්තිකාරම් ලබාගෙන තිබේනම් එය ප්‍රශ්නයක් බව ද මෙම ලිපිය ලබා දීම සම්බන්ධව සභාවේ විරෝධතාවයක් තිබේනම් ඉදිරිපත් කරන ලෙස ද නොඑසේනම් අද දිනයේ දීම ලිපිය ලබා දීමට හැකි බව ද එයට ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගෙන පැමිණෙන ලෙස ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් පසුගිය සභාවක දී මේ සම්බන්ධව සාකච්ඡා කළ අතර, හිතවත්කම් හා මානුෂීයව බලන විට ගරු මන්ත්‍රීවරුන් කරනු ලබන ඉල්ලීම ගැටලුවක් නොමැති බව ද රජයේ දේපලක් නියමිත ටෙන්ඩර් කාලය අවසානයේ රජයේ තීන්දු තීරණ අනුව නිවැරදි ක්‍රමවේදයකට යන්නේ නම් එය හොඳ බව ද පසුගිය කොරෝනා කාලය තුල අවශ්‍ය කරන සියලුම ඉල්ලීම්, කපා හැරීම්, අඩු කිරීම් ආදී සියල්ලම ඒකමතිකව අනුමත කර ලබා දුන්

බව ද පසුගිය සභාවේ දී බාරගෙන ඇති විවාහ උත්සව කොපමණ ද? මුදල් කීයක් අරන් තිබෙන්නේ ද? යන්න බලා තැන්පත් මුදලින් අවශ්‍ය කරන මුදල සභාවට ලබා ගෙන ඒ මුදල්වලින් විවාහ උත්සව පැවැත්වීමට සාකච්ඡා කළ බව ද පැවසීය.

එමෙන්ම මෙම නගර සභාව 2018 වසරේ වෙනස් වනතුරු දශක ගණනාවක් තිස්සේ සාමාජීයව වැරදි පූර්වාදර්ශයක් ලබා දී තිබුණු බව ද එවකට සිටි ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා හා ගරු නාගරික මන්ත්‍රීවරු සියලු දෙනාම සභා දේපලෙන් යැපෙන බවට සමාජයේ මතයක් තිබුණු බව ද එම මතය පසුගිය වසර 04 ක කාලය තුල වෙනස් කළ අතර, සත්‍ය, සාධාරණ හා විනිවිදභාවයෙන් පවත්වාගෙන ආ බව ද බළන්ගොඩ නගර සභා පාලන බලය වෙනස් වීමෙන් පසුව නැවත වරක් රාජ්‍ය දේපලවලින් ජීවත්වන බව සමාජය විසින් කිව හැකි අතර, එය ගරු සභාපතිතුමාගේ පාලනයට හොඳ නැති බව ද මානුෂීයව සාධාරණ නමුත් නීතිය හා සාධාරණත්වයෙන් බලන විට එම ඉල්ලීම නුසුදුසු බව ද ඥාති හිතවත්කම්, ආගම් කුල හිතවත්කම් නොමැතිව සාධාරණ ලෙස සියලුම දෙනාට පරිහරණය කළ හැකි විය යුතු බැවින් රජයේ තිබෙන ක්‍රමවේදයන්ට අනුව සභාවේ දේපල බදු දෙන්නේ නම් නිසි ක්‍රමවේදයකට අනුව සිදු කරන ලෙස ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් තමන් ඇතුළු මෙම ස්ථානයේ සිටින ගරු මන්ත්‍රීවරුන් අවුරුදු 15 ක් සභාව පාලනය කළ අතර, කිසිදු දේපලක් අනිසි ලෙස පාලනය නොකළ බව ද හොරකම් නොකළ බව ද එබැවින් එම කතාව ඉල්ලා අස් කරගන්නා ලෙස ද පැවසීය.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අතර කෑකෝ ගැසීමක් ඇති විය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් තම තමන්ගේ අදහස් ඉදිරිපත් කිරීමට අයිතියක් ඇති අතර, තානායම ටෙන්ඩර් කිරීමට යෝජනාවක් ස්ථිර වී ඇති බව ද වැරදි දෙයකට සභාපති වශයෙන් තමන් අත්සන් නොකරන බව ද ඒ අනුව යෝජනාව පරිදි කටයුතු සිදු කරන ලෙස ද ගරු ආණ්ඩුකාරතුමා නිවැරදි තීරණයක් ලබා දුනහොත් එතුමාට හොඳ බව ද වැරදි තීන්දුවක් ලබා දුනහොත් එය විවේචනයකට ලක් විය හැකි බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා බෙදීමකට යාමට යෝජනාවක් තමන් නොකළ අතර, පැහැදිලි කිරීමක් පමණක් කළ බව පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් එරික් සිසිල් යන අය ගරු ආණ්ඩුකාකරතුමාට අභියාචනාවක් කර අවශ්‍ය අනුමැතිය ලබාගෙන පැමිණියේ නම් නීත්‍යානුකූලව කළ හැකි බව ද බහුතර කැමැත්ත ගැන අදහසක් ලබා දෙන ලෙස ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා පැවසුවේ ගරු ආණ්ඩුකාරතුමාට අභියාචනාවක් ඉදිරිපත් කර උත්සාහයක් ගන්නා ලෙසයි.

ගරු සභාපතිතුමා නැවත වරක් අදහස් දක්වමින් 2022-01-21 දිනැති විශේෂ මහ සභාවේ දී 2022 ජනවාරි 31 දිනට පෙර ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමට නොහැකි වුවහොත් ටෙන්ඩර් කරන ලෙස ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ද පවසා ඇති නමුත් යම් කිසි හේතුවක් මත එය ලබා ගැනීමට නොහැකි වන්නට ඇති බව ද සභාවේ ලබා දෙන තීරණයට තමන් ගරු කරන බව ද එය අනුමත කරන බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් තානායමේ බඳවා ගැනීම් ඇතුළු කටයුතු සම්බන්ධව වංචා දූෂණ යටතේ විමර්ශන සිදු වන බවද පොහොය දින අරක්කු ව්‍යාපාරය කිරීම නිසා මහජන මුදලින් ලක්ෂ 16 හමාරක් පමණ ගෙවා ඇති බව ද මේ සියල්ල මෙම කළමණාකාරිත්වය තුලින් වූ බව ද එම නිසා සභාව විසින් නොව අදාල ටෙන්ඩර්කරු විසින් කරුණු පැවසිය යුතු බව ද පවසන ලදී.

අනතුරුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව නව තක්සේරුව මුදල ගෙවීමට එකඟ වෙමින් තානායම ටෙන්ඩර් කිරීම වසර දෙකකින් දීර්ඝ කිරීම සඳහා වන යෝජනාවට බෙදීමක් අවශ්‍ය බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසුවේ බෙදීම අනුව තීරණය ගරු ආණ්ඩුකාරතුමාට යොමු කරන අතර, අනුමැතිය ලබා නොදුනහොත් පෙබරවාරි 15 වන දින වන විට තානායමේ බඩු බහාරාදිය බාර ගැනීමට සිදු වන බවයි.

ඒ අනුව ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද, රහස් ඡන්දයක්ද යන්න යෝජනා ස්ථිර කර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහි දී විවෘත ඡන්දයකට යාම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා කළ යෝජනාව ගරු උප සභාපති එම්. ටී.එම්.රුමි මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව නව තක්සේරු මුදල ගෙවීමට එකඟ වෙමින් තානායම ටෙන්ඩර් කිරීම වසර දෙකකින් දීර්ඝ කිරීම සඳහා වන යෝජනාවට පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම් වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී, එම යෝජනාවට පක්ෂව සභිකයින් නව දෙනෙකු ද එනම්,

1. ගරු සභාපති ඩබ්. ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා
2. ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය
9. ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය ද

විපක්ෂව සභිකයින් හතර දෙනෙකු ද එනම්,

1. ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා

3. ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා

4. ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ද

ඡන්දයෙන් වැළකී සිටි සභිකයින් එක් අයෙකු ද එනම්,

1. ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. ජේමදාස මැතිතුමා යන අයද

ඡන්දය ප්‍රකාශ කළ අතර, සභාවට නොපැමිණි ගරු සභිකයින් තුන් දෙනෙකු ද වේ.

1. ගරු නාගරික මන්ත්‍රී එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය
3. ගරු නාගරික මන්ත්‍රිනි එම්. ශාන්තිලේඛා මැතිතුමිය

ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව නව තක්සේරු මුදල ගෙවීමට එකග වෙමින් තානායම ටෙන්ඩර් කිරීම වසර දෙකකින් දීර්ඝ කිරීම සඳහා වන යෝජනාව පක්ෂව ඡන්ද නවයක් ද විපක්ෂව ඡන්ද හතරක් ද වැළකී සිටීම් එකක් ද වශයෙන් වැඩි ඡන්ද පහකින් සභා සම්මත විය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ඉරිදා පොළ පිරිසිදු කිරීම සම්බන්ධව සෞඛ්‍ය කමිටුව හරහා අවශ්‍ය දේ කරන බව ද මාළු කඩය අසල වැසිකිළිය ලක්ෂ 39 ක් වියදම් කර ඉදි කර ඇති අතර, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී වීරසිංහ මැතිතුමා සභාපතිව සිටි කාලයේ සියලු දෙනාගෙන් උපදෙස් ලබා ගෙන වැඩ කළ බව කියූ නමුත් වැඩ කිරීමේ වේගය අනුව තනි තීරණ ගෙන කටයුතු කළ බව ද එම වැසිකිළියෙහි ෆිල්ටරය සවි කළ දවසේ සිටම ක්‍රියා නොකරන බව ද සුදුසු ස්ථානයක් බලා සෞඛ්‍ය කමිටුව මගින් සිදු කිරීම සුදුසු බව ද බ්ලොක් ගල් නිෂ්පාදනය සම්බන්ධව දන්නා අය සිටීනම් සම්බන්ධ කර දෙන ලෙස ද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු බඳවා ගැනීම සඳහා ලිපි මගින් අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතින බව ද නිත්‍ය තනතුරු සඳහා පිහිටුවන ලෙස පැවසූ නමුත් දේශපාලන හිතවත්කම් මත හිටපු ගරු සභාපතිතුමන්ලා බඳවා ගැනීම් කර ඇති නමුත් තමුන් එවැනි බඳවා ගැනීම් සිදු නොකරන අතර, පලිගැනීම් සිදු නොකරන බව ද පවසන ලදී.

**08:03 ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

08:03:01 බළන්ගොඩ, මිරිස්වත්ත සුබයිර් අලීම් මාවත කොන්ක්‍රීට් කර ඇති කොටස කැඩීම නිසා අබලන් වී ඇත.එම පාරට ප්‍රිමික්ස් යොදා සංවර්ධනය කිරීම

08:03:02 බළන්ගොඩ කහටපිටිය පාර, මුස්තාපා මාවතට පිවිසෙන මාර්ග හා අවසන් කොටස කඩිනමින් අලුත්වැඩියා කිරීම

08:03:03 සුබයිර් අලීම් මාවත දෙවැනි පටුමග මැද කොටස අඩි 30කට පමණ කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:04 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

08:04:01 ආපදා අවස්ථාවන්හි ගිනි නිවන රථයට අවශ්‍ය ජලය ලබා ගැනීම සඳහා ජල සම්පත් මණ්ඩලය සමඟ කතිකා කරගෙන නගරයේ ජලය ලබා ගැනීමට අවශ්‍ය ජල කරාම කීපයක් ලෑස්ති කර තැබීම

08:04:02 නගරයේ වෙළඳසැල්වලට බලපත්‍ර 2022 වසරට ලබා දීමේ දී කුඩා ගිනි නිවන උපකරණයක් සවි කිරීමට උපදෙස් දීම

08:04:03 සෙලාන් බැංකුව ඉදිරිපිටින් ඇති හිල්සයිඩ් මාවතේ දේශබන්දු මහතාගේ නිවස අසල සිට කරව්කැටිය කොටුව මාර්ගය දක්වා ඇති කෙටි මාර්ගය පයින් ඇවිදීමට සුදුසු ආකාරයට මට්ටම් කර දීම

08:04:04 මේ දිනවල නගරය පුරා ලංකා විදුලි බල මණ්ඩලය විසින් විශාල කණු ස්ථාපනය කරගෙන යන බැවින් එම කාණු වීදිවලට සහ ගොඩනැගිලිවලට අවහිර නොවන පරිදි ස්ථාපනය කිරීමට මැදිහත් වීම

08:04:05 නගරයේ විදුලි කණුවල හෝ ටෙලිකොම් කණුවල දකුම්කළු කුඩා කුණු කුඩයක් එල්ලීමට කටයුතු කිරීම

08:04:06 මොහාන් එල්ලාවල මාවතේ විදුලි කණු පාර මැද සිටුවා විදුලි බුබුළු දෙපැත්තට විහිදෙන සේ දර්ශනීය ලෙස මාර්ගය නිර්මාණය කිරීම

08:04:07 නගරයේ නව බස් රථ නැවතුම්පොළේ පැන්තාලියක් සවිකර මහජනතාවට සේවය සැපයීම හා ගුවන් පාලම යට කඩ කාමරයක් ඉදි කිරීම

08:04:08 නගරයේ හෝරා ස්ථම්භය අසල වට රවුමේ සහ මර්කන්ටයිල් වට රවුමේ පදික වැටවල් ඇති ස්ථානවල වැටට කොඩි දර්ශනය කරවීමට හැකි වන සේ යකඩ බට කෑලි වෑල්ඩින් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම (ජාතික වෙසක් උත්සවය ද කුරගල පැවැත්වෙන බැවින්)

08:04:09 මර්ක්නටයිල් හංදිය ක්‍රමවත් කිරීම (මේ සඳහා සැලැස්මක් ඉදිරිපත් කර ඇත)

08:04:10 සභාපතිතුමාගේ කැමැත්ත ඇතිව තුඹගොඩ හංදියේ වැට පස්සට කොට හැකි අයුරින් නිරීක්ෂණය කල ආකාරයට පුළුල් කිරීම

08:04:11 ක්‍රීඩාංගනයේ රථ වාහන අංගනය කොටසේ පස් ඉවත් තරන බැවින් එම ස්ථානයේ ඇති යකඩ බාර් දෙක නගර සභා අයිතිය ඇති ස්ථානයකට ගෙනවිත් දැමීම

08:04:12 නගරයේ අලුතින් සවි කර ඇති විදුලි ලාම්පු මෙන් නගරයේම කොටසක් වන නගර සභාවට අයිතිය ඇති සිරි වීර සුන්දරාරාම මාවතට ද ලාම්පු කීපයක් සවි කර ආලෝකමත් කර දෙන ලෙස ඉල්ලීම. මෙය වීරසුන්දරාරාමාධිපති ස්වාමීන් වහනසේගේ ඉල්ලීමකි.

08:04:13 ඇවිදින මංතීරුව වෙතට නව මහජන පොළෙන් ඇතුල් විය හැකි දොරටු වසා දැමීම

08:04:14 ඇවිදින මංතීරුව නිර්මාණය කිරීමෙන් පසුව නව මහජන පොළේ ව්‍යාපාරිකයන් හට තම අවශ්‍යතා සඳහා ගඟට ඇතුල් විය නොහැක. එම ව්‍යාපාරිකයන්ට අවශ්‍ය ජලය ලබා ගැනීම සඳහා ජල කරාමයක් මහජන පොළෙහි කෙළවරේ සවි කර දීම

08:04:15 සමුජන හෝටලය, හිල්විව් හෝටලය, නව ලංකා හෝටලය යන ව්‍යාපාරවලින් පිටුපස ඇති කාණුව නගරයට සම්බන්ධ වන්නේ කෝයා ඩේලි කිඩ්ස් ආයතනය අසලිනි. එම කුණු කාණුව ඉතාම අපිරිසිදු තත්ත්වයේ පවතින නිසා එය පවිත්‍ර කර කාණු අඩිය කොන්ක්‍රීට් කර දීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් තමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සම්බන්ධව විස්තර කරමින් එම කටයුතු ඉටු කර දෙන ලෙස පවසන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා, අවශ්‍ය නිළධාරීන් සම්බන්ධ කර දෙන අතර, එම නිළධාරීන් සමඟ එකතු වී මෙම යෝජනා අතරින් කළ හැකි කටයුතු පිළිබඳව අවධානය යොමු කරන ලෙස ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාට පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:05 ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

08:05:01 ඇල්ලෙඅරාව ගමට පානීය ජලය ලබා දීම

08:05:02 ඇල්ලෙආරව එක්සත් මාවත සංවර්ධනය කිරීම

08:05:03 ඇල්ලෙආරව දෙවට පාර සංවර්ධනය කිරීම

08:05:04 ඇල්ලෙඅරාව අයි.පී. සරත් මහතාගේ නිවසට යන පාර සංවර්ධනය කිරීම

08:05:05 ඕලුගංතොට ලලිත් මහතාගේ නිවස ඉදිරිපිට පාර සංවර්ධනය කිරීම

08:05:06 පුරණ ගෙදර අවසාන කොටස සංවර්ධනය කිරීම

08:05:07 පුරණගෙදර ඇල වේල්ල සංවර්ධනය කිරීම

08:05:08 ගම ගෙදර කාණු පද්ධතියේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම

08:05:09 රයිවත්ත මෝචරිය අසල උපුල් චමින්ද මහතාගේ නිවෙස්වලට යන පාර සංවර්ධනය කිරීම

08:05:10 ඕලුගංතොට මඬේවත්ත පාර වෛද්‍ය ජයන්ත මහතාගේ නිවසේ සිට උපුල් මහතාගේ නිවෙස්වලට යන පාර සංවර්ධනය කිරීම

08:05:11 වංගුවේ ගෙදර අසලින් වලවේ ගඟට බසින පඩිපෙළ නඩත්තු කිරීම

08:05:12 රස දහර හෝටලය අසල සිට ලලිත් මහතාගේ නිවස අසලට සංවර්ධනය කිරීම

08:05:13 සියඹලාගහවත්ත පාර පැති බැමි යොදා සංවර්ධනය කිරීම

08:05:14 ජනපද පාර කාණු පද්ධතිය හා පාර සංවර්ධනය කිරීම

08:05:15 ස්වයං රැකියා සඳහා ආධාර ලබා දීම

08:05:16 වැසිකිළි ආධාර ලබා දීම

08:05:17 ශිෂ්‍යත්ව ආධාර ලබා දීම

08:05:18 අඩු ආදායම්ලාභීන්ට බඩු මල්ලක් ලබා දීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් මෙම යෝජනා 2022 අයවැය සඳහා ඉදිරිපත් කළ බව ද එම යෝජනා අතරින් ගම ගෙදර කාණු පද්ධතියේ මීටර 05 ක් පමණ කොන්ක්‍රීට් කිරීමට ඇති අතර, පැතිබැම්ම ඉදි කරන අවස්ථාවේ දී එම කොටසත් ඇතුලත් කර සංවර්ධනය කරන ලෙස ද පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුවේ කර්මාන්ත කමිටුවේ සභාපතිතුමා එහි වගකීම බාර ගන්නා ලෙසයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:06 ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

08:06:01 කරව්කැටිය උඩ කන්ද පාර සංවර්ධනය කිරීම

08:06:02 බළන්ගොඩ නගරයේ කාණු මාසයකට හෝ සැරයක් සම්පූර්ණයෙන්ම පිරිසිදු කිරීම

08:06:03 බළන්ගොඩ නගරය තුල පවත්වන උපකාරක පන්ති සඳහා යොදා ගන්නා පත්‍රිකා නගරය තුල දරුවන් විසි කරන අතර, එය නැවැත්වීමට වැඩ පිළිවෙලක් සකස් කිරීම

08:06:04 කාන්තාවන් ස්වයං රැකියා සඳහා යොමු කිරීමට සඳහා වැඩමුළු පැවැත්වීමට අනුමැතිය ලබා ගැනීම

08:06:05 නගර සභාව තුල තිබූ බුදු පිළිම වහන්සේ හැමෝටම පෙනෙන ආකාරයෙන් නගර සභාව ඉදිරිපිට ස්ථාපනය කිරීම

08:06:06 සියලුම අතුරු මාර්ග සංවර්ධනය කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් කරව්කැටිය උඩකන්ද පාර පසුගිය කාලයේ කාපට් කරන බව පැවසූ නමුත් එය නොකෙරුණු අතර, වසර 04 ක් තිස්සේ කොටස් වශයෙන් නඩත්තු කිරීමෙන් සභාවේ විශාල මුදලක් නාස්ති වූ බව ද ඉදිරියේ දී ලැබෙන ව්‍යාපෘතියකින් මෙම මාර්ගය සංවර්ධනය කර දෙන ලෙස ද මෙම ප්‍රදේශයේ පවුල් 1800 ක් පමණ ජීවත් වන බව ද පැවසූ අතර, අනිකුත් යෝජනා සඳහා ද අවධානය යොමු කර අවශ්‍ය කටයුතු- සිදු කරන ලෙස පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:07 ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය**

08:07:01 කෝපිවත්ත මාර්ගයේ අශෝකා මහත්මියගේ නිවස අසල සිට සුනිල් රණතුංග මහතාගේ නිවස දක්වා වූ මාර්ගයේ ඉතිරි වී ඇති මීටර 60ක පමණ කොටසට කොන්ක්‍රීට් ඇතිරීම

08:07:02 සුදර්ශනගම ගාමිණී මහතාගේ නිවස අසල සිට ආනන්දසීලි රංදෙණිය මහත්මියගේ නිවස දක්වා වූ කාණු පද්ධතිය සංවර්ධනය කිරීම

08:07:03 හුණුකුඹුර දෙල්ගස්වත්ත මාර්ගයේ වසුමනී මහත්මියගේ නිවස ඉදිරිපිට කාණු පද්ධතිය සංවර්ධනය කිරීම

08:07:04 කෝපිවත්ත මාර්ගයේ දෙපස සුද්ධ කර කාණු පද්ධතිය සුද්ධ කිරීමට අවශ්‍ය කටයුතු සැලසීම

08:07:05 කෝපිවත්ත මාර්ගයේ සිට දොරවෙල ඔය දක්වා වූ අඩි තුනේ මාර්ගයේ නැවත වල් බිහි වී ඇති බැවින් එය නැවත සුද්ධ කිරීම

08:07:06 බුලත්ගම වැවවත්ත උද්‍යානය ළඟ සිට ආනන්ද මෛත්‍රී මාවත දක්වා වූ වෙල මැදින් ලබා දී ඇති මාර්ගය වැසී ඇති බැවින් එම මාර්ගය නැවත ජනතාවට ගමන් කිරීමට හැකිවන පරිදි නැවත සංවර්ධනය කර දීම

08:07:07 හුණුකුඹුර මාර්ගයේ සිට කෝපිවත්ත මාර්ගය යා කෙරෙන මාර්ගය (රොෂාන් කැලිස්ටස් මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගය) මීටර 70 ක් පමණ කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් ඉහත යෝජනා සියල්ල ඉටු කර දෙන ලෙස ද විශේෂයෙන් කෝපිවත්ත කාණු පද්ධතිය පළල් නොවීම හේතුවෙන් කාපට් පාර වෙත වතුර ගලා එන බව ද ඒ සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරියෙන් පරීක්ෂා කළ අතර, වැඩ අධිකාරීතුමා කඩිනමින් කාණුව සකස් කර දෙන බව පැවසූ බව ද එය ඉටු කර දෙන ලෙස ද 08:07:06 යෝජනාවේ සඳහන් අඩි පාර ත්‍රිවිල් රථයක් ගමන් කිරීමට හැකි වන පරිදි සකස් කර ගැනීමට නගර සභාව විසින් අධීක්ෂණය කර, පාර නිදහස් කර දෙන ලෙස ද 08:07:05 යෝජනාව සම්බන්ධව අදාල සමිතියේ නිළධාරීන් පැමිණ ගරු සභාපතිතුමා හමු වූ අවස්ථාවේ අදාල නිළධාරීන්ට මෙය ඉටු කරන ලෙස පවසා තිබූ බැවින් ඒ සම්බන්ධව විශේෂ ස්තුතියක් පළ කරන බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:08 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

08:08:01 බුලත්ගම පොදු සුසාන භූමියේ නඩත්තු කටයුතු ක්‍රමවත්ව සිදු කිරීම සහ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම

08:08:02 නඩත්තු යෝජනා යටතේ වැඩ ආරම්භ කර අතරමග නවතා ඇති ලේඩිස්මිත්ත පළමු පටුමග මාර්ගය (අසංක අම්පිටියාවත්ත මහතාගේ නිවස පාර) සහ පල්ලෙවෙල ගම මධ්‍යයේ සුසිලා මහත්මියගේ නිවස අසල බෝක්කුව සංවර්ධනය කර වැඩ අවසන් කිරීම

08:08:03 ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ සංවර්ධනය කල පල්ලෙවෙල වෙල අද්දර මාර්ගයේ පිවිසුම සහ ඉදිරි කොටස සංවර්ධනය කිරීම

08:08:04 ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ සංවර්ධනය කල බුලත්ගම බෝධිය අසල මාර්ගයේ පාර කැඩී යන ස්ථානයේ පැති බැම්ම සකස් කිරීම

08:08:05 තුඹගොඩ, කපු කඩය පිටුපස සාංඝික මහා සුදර්මාරාම විහාරස්ථානයේ භූමිය හරහා වැටී ඇති අප ජලය බැහැරලීමේ නගර සභාවට අයත් කාණුව සංවර්ධනය කිරීම හා එහි ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව බුලත්ගම එක්සත් මිතුරු සංසදය වෙත ලබා දීම

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් බුලත්ගම පොදු සුසාන භූමිය අක්‍රමවත්ව පවතින අතර, ඒ සම්බන්ධව සෞඛ්‍ය අංශයේ අධීක්ෂණ නිළධාරීන් සොයා බැලිය යුතු බව ද දෛනික වැටුපට හෝ කම්කරුවෙකු යොදවන ලෙසද පවසන ලදී.

එමෙන්ම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාගේ උපදෙස් මත සහ ගරු සභාපතිතුමාගේ අවසරය පරිදි තුඹගොඩ, කපු කඩය පිටුපස සාංඝික මහා සුදර්මාරාම විහාරස්ථානයේ භූමිය හරහා වැටී ඇති අප ජලය බැහැරලීමේ නගර සභාවට අයත් කාණුව සංවර්ධනය කිරීමේ යෝජනාව ඉදිරිපත් කරන බවද මීට පෙර අවස්ථා කිහිපයක දී ගරු මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකු සභාවෙන් ඉල්ලීම් කළ ද කිසිදු උත්සාහයක් සාර්ථක කර ගැනීමට නොහැකි වූ බවද මේ සම්බන්ධව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා විසින් ගරු සභාපතිතුමාව දැනුවත් කළ බව ද කඩිනමින් මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ද පසුගිය දිනක රිය අනතුරක් හේතුවෙන් මිය ගිය රාස්සගල ප්‍රදේශයේ තරුණයා සිහිපත් කර ඔහුගේ තෙමස් පූර්ණ

පිංකමට පෙර එම මව්පියන් රාස්සගල පාර මගී ආවරණයක් සාදා දීමේ බලාපොරොත්තුවෙන් සිටින බව ද ඒ සඳහා ගරු සභාවේ සහයෝගය ලබා දීමට කටයුතු කරන ලෙස ද පවසන ලදී.

මේ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙමඟින් සමාජයට වැඩදායී ක්‍රම දෙකක් සිදු වන බව ද මේ සඳහා ව්‍යාපෘතියක මුදල් ලැබෙන නමුත් එම මුදල් ලැබුණා හෝ නොලැබුණා හෝ කාණුව ඉදි කර දුනහොත් ස්වාමීන් වහන්සේ විසින් රාස්සගල පාරට මගී නැවතුම්පළක් ඉදි කිරීමට ඉඩම ලබා දෙන බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ තම දරුවාගේ පින්තූරයක් සමඟ මගී නැවතුම්පළක් ඉදි කිරීමට සම්පූර්ණ වියදම දැරීමට කැමති අයෙකු සිටින බවයි.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් සභාව විසින් ලබා දෙන නිර්දේශ අනුව එම ඉදි කිරීම සිදු විය යුතු බව පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා විමධ්‍යගත අරමුදලින් රුපියල් ලක්ෂ 03 ක් මේ සඳහා ලබා දෙන බව පවසා ඇති බව සඳහන් කළේය.

ගරු සභාපතිතුමා පැවසුවේ සෞඛ්‍ය කමිටුවේ සභාපතිවරයාගේ ප්‍රධාන වගකීම මෙම කාර්යය බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:09 ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා**

08:09:01 වැවේගෙදර මාර්ගය පුළුල් කර සංවර්ධනය කිරීම

08:09:02 (අක්කර 18) සමගි මාවතේ දකුණු පස පළමු පටුමග මාර්ග කොටස තාර දමා කාණු සකසා නඩත්තු කර සංවර්ධනය කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:10 ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

08:10:01 දොරවෙල සුනිල් හඳපාන්ගොඩ මහතාගේ නිවසට යන මාර්ගය නඩත්තු කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:11 ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා**

08:11:01 පරගහකුඹුර මාර්ගයේ නඩත්තු කටයුතු සිදු කර ගෙන යාමේ දී අතරමග නැවතුණු අතර, ඉතිරි කොටස සංවර්ධනය කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් මෙම මන්ත්‍රී යෝජනා සඳහා මුදල් ලැබෙන්නේ කෙසේද? යන්න විමසීය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් අයවැය මගින් ගරු නාගරික මන්ත්‍රීවරුන් 17 දෙනා වෙනුවෙන් මිලියන 17 ක් වෙන් කර ඇති බව ද යෝජනාවක් යොමු කළහොත් ප්‍රතික්ෂේප කළ නොහැකි අතර, ප්‍රායෝගිකව සිතා බලා යෝජනා ලබා දිය යුතු බව ද මිලියන 17 සඳහා මුලින්ම යෝජනා ලබා දෙන ලෙස ද ඉන්පසුව කමිටු හරහා අවශ්‍ය යෝජනා ක්‍රියාත්මක කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන බව ද පවසන ලදී.

**09. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**10. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

2022-01-01 සිට 2022-01-31 දක්වා ආදායම් හා වියදම්

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 12,616,264.83 |
| වෙනත් ලැබීම් | 3,038,939.02 |
| මුලු ලැබීම් | 15,655,203.85 |
| පුනරාවර්තන වියදම් | 6,863,575.52 |
| වෙනත් වියදම් | 6,106,433.39 |
| මුලු වියදම් | 12,970,008.91 |

2022-01-01 සිට 2022-01-31 දක්වා ඉන්ධන වාර්තාව

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 56-1906 | 10,214.82 |
| 227-5020 | 29,788.22 |
| RD - 8240 | 34,606.00 |
| 226-7521 | 13,345.09 |
| BC-0005 | 0.00 |
| GC 0001 | 9,558.00 |
| LL - 7688 | 8,228.00 |

| | |
|---|---|
| DDR 0008 | 0.00 |
| JD-4684 | 1,770.00 |
| LL-2110 | 708.00 |
| ND-5124 | 27,831.21 |
| PF-4006 | 34,185.00 |
| QL-2901 | 7,212.75 |
| RC-1107 | 0.00 |
| RE 2600 | 5,566.00 |
| 37-7933 | 14,437.00 |

| | |
|---|---|
| RC 8183 | 23,523.50 |
| HF 8558 | 2,420.00 |
| VI 1833 | 1,416.00 |
| RB 4786 | 5,445.00 |
| RC 1118 | 13,794.00 |
| ZA 5039 | 103,229.00 |
| GK 1483 | 7,381.00 |

| | |
|---|---|
| RD 8000 | 19,360.00 |
| DPP 0006 | 3,910.00 |
| OV/M 0017 | 885.00 |
| UQ 1933 | 3,540.00 |
| **එකතුව** | 382,353.59 |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**11. ඇස්තමේන්තු අනුමත කිරීම**

**11.01 ගරු සභාපති ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා**

11.01.01 තුඹගොඩ කජු කඩය පිටුපස සාංඝික මහා සුධර්මාරාම විහාරස්ථාන භූමිය හරහා වැටී ඇති අප ජලය බැහැර කරන නගර සභාවට අයත් කාණුව සංවර්ධනය කිරීම - රු.3,048,800.00

ඉහත සඳහන් ඇස්තමේන්තු යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**12. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය අදහස් දක්වමින් මුගුණමල පාර, වටරවුම් පාරේ ජල ටැංකිය පිරිසිදු කර, ජල කරාම යොදා දැන්වීම් පුවරුවක් සවි කර දෙන ලෙස ද බුලත්ගම සුසානභූමිය පිරිසිදු කරන ලෙස ද නගරයේ අලංකාරය සඳහා වට රවුම් පාරේ රෝස මල් සිටුවන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් සභාවේ විශාල මුදලක් පවතින අතර, එම මුදල් ලබා දී හැකි ඉක්මනින් නගරයේ වැඩ කටයුතු කර ගැනීමට අවස්ථාව සලසා දෙන ලෙස ද ගරු සභාපතිතුමාට මාස 04ක් නොව සභා වාරයම සිටීමට හේතු වාසනා ලැබේවා යි ප්‍රාර්ථනා කරන බව ද පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් තුඹගොඩ, ආනන්ද මෛත්‍රිය මාවතෙන් ප්‍රධාන මාර්ගයට ඇතුල්වන ස්ථානයේ වාහන දෙපසම නවතා තැබීම නිසා විශාල තදබදයක් පවතින අතර, එම නිසා අනතුරුදායක තත්ත්වයක් නිර්මාණය වී ඇති බව ද මේ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කර හැකි ඉක්මනින් සුදු ඉරක් යොදා වාහන එක් පැත්තකින් නවතා තැබීමට අවශ්‍ය කටයුතු සිදු

කරන ලෙස ද කොට්ඨාස 10 තුල පවතින කාණු සුද්ධ කළ යුතු බව ද බුලත්ගම පොදු සුසාන භූමිය පිරිසිදු කරන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් පසුගිය කාලයේ දී නගරයේ සංවර්ධනයට හා බදු ගෙවන ජනතාවට සේවය කිරීමට යහපත් තීන්දු තීරණ රාශියක් ගත් බව ද එම තීරණ ක්‍රියාත්මක කිරීමට කමිටු පත් කළ අතර, කර්මාන්ත කමිටුවේ සභාපති වශයෙන් තමන්ට බාරදුන් වැඩ කටයුතු වගකීමෙන් ඉටු කරන බව ද ඒ වෙනුවෙන් ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ හා කාර්ය මණ්ඩලයේ සහයෝගය ලබා දෙන ලෙස ද සභාවේ පුද්ගලික න්‍යාය පත්‍ර ක්‍රියාත්මක නොකර, පුද්ගලික ජීවිතවලට මඩ ගැසීම් සිදු නොකර ආදර්ශමත්ව හැසිරෙන ලෙස සියලුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින බව ද ගරු සභාපතිතුමාට එතුමාගේ කාලය තුළ අවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කර ගැනීමට අවශ්‍ය ශක්තිය හැකියාව හා නීරෝගිකම ලැබේවායි ප්‍රාර්ථනා කරමින් සියලුම දෙනාට සුභ අනාගතයක් වේවායි පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් තමන් ගරු සභාපතිතුමාට අසාධාරණකම් කළ බවට නිතරම පවසන නමුදු රජයෙන් ඊට වඩා අසාධාරණකම් වූ බව ද අද දින කතා කළ බෝක්කු කාණු ආදිය සම්බන්ධව අදාල නිළධාරීන්ට උපදෙස් ලබා දී ප්‍රගතිය දෙන ලෙස තමන් පවසා ඇති බව ද සුසාන භූමිය සම්බන්ධව ද ඒ ආකාරයෙන්ම කටයුතු කළ නමුත් පසුගිය කාලයේ ඇති වූ ගැටලුකාරී තත්ත්වයන් මත මග හැරුණු අවස්ථා තිබුණු බව ද දේශපාලන ප්‍රශ්න මත පසුගිය වසර දෙක හමාරක් තිස්සේ නගරයේ සංවර්ධනය කිරිමට නොහැකි වූ අතර, එදා වියදම අද දෙගුණයක් වී ඇති නිසා එහි පාඩුව විඳීමට සිදුව ඇත්තේ ගරු සභාවටම බව ද නිරන්තරයෙන්ම සභාවේ ගැටලු ඇති වූයේ පුද්ගලික කාරණා අරමුණු කරගෙන ඉදිරිපත් කළ යෝජනාවලට බැවින් එවැනි යෝජනා ඉදිරිපත් නොකරන ලෙස ද බදු ගෙවන ජනතාව වෙනුවෙන් කරනු ලබන සියලු සංවර්ධන කටයුතු වල දී උපරිම සහය ගරු සභාපතිතුමා වෙත ලබා දෙන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් තමන් 1991 සිට වැඩි මනාප ගෙන සභාව කීර්තිමත් සභාවක් කළ අයෙකු වන අතර, පාර්ලිමේන්තු නියෝජනයක් නොමැතිව ගරු ආණ්ඩුකාරවරයෙකු වූ මොහාන් එල්ලාවල මැතිතුමාගේ සහය ලබා ගෙන බළන්ගොඩ සංවර්ධනය කළ බව ද තමන් මෙවර ජාතික ලැයිස්තුවෙන් පැමිණ තනි වීමට සිදු වූ බව ද නගර සභාව අවුරුදු කීපයකට ආපස්සට ගිය බව ද ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා සමග එක්ව සිටියහොත් බළන්ගොඩට කර ගැනීමට නොහැකි වූ බොහෝ දේ කර ගත හැකි වන බැවින් ගරු සභාපතිතුමා පත් කර ගැනීමේ දී ඡන්දය ලබා දුන් බව ද තමන්ට තරග කරන ලෙස එදින උදේ හිටපු සභාපතිතුමා පැවසූ බව ද තමන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ දිස්ත්‍රික් සංවිධායක වශයෙන් මධ්‍යම කාරක සභාවට සහභාගී වූ අතර, එහි දී යෝජනා 16 ක් සම්මත කර ගත් බව ද පක්ෂයක් වශයෙන් ප්‍රවර්ධනය වන නමුත් බළන්ගොඩ එය සිදු නොවන බව ද ජනතා විමුක්ති පෙරමුණෙහි සමුළුවක් පසුගිය දිනක පැවති බව ද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන යෝජනාවලිය ඊළඟ සභාවට ඉදිරිපත් කරන බව ද ඇතැම් මැති ඇමතිවරුන් හිටපු

ජනාධිපතිතුමාට කතා කරන ආකාරය පිළිබඳව කණගාටුවට පත්වන අතර, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය රජයෙන් ඉවත් නොවන බව ද අද උද්ධමනය වැඩි වී ඇති අතර, පසු ගිය දිනක වැඩ ලක්ෂයකට මුල්ගල තිබූ නමුත් ඒ සඳහා ඇස්තමේන්තු හෝ ටෙන්ඩර්කරුවන් නොමැති අතර, එම වැඩ කෙරෙයි ද යන්න නොදන්නා බව ද කාපට් ව්‍යාපෘතිය තවම නොකෙරුණු අතර, තමන්ට සංවර්ධනය වෙනුවෙන් වෙන් කළා යැයි පැවසූ මුදල් නොලැබුණු බවද ඩේවිඩ් යන අයට කඩය ලබා දීම සම්බන්ධව නඩුවකට වුව යා හැකි බව ද ගිවිසුම් කඩ කර ඇති අතර, මුදල් නොතිබුණු ඩේවිඩ් යන අයට දින ගණන ඇතුලත මුදල් ලැබීම ප්‍රශ්නයක් බව ද ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා සමඟ එකඟතාවයකට පැමිණි බව ද ජනාධිපතිවරණයේ දී ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ඡන්දය ලබා දෙන ලෙස ගෙයින් ගෙට ගොස් පැවසූ අතර, එහි දී මැති ඇමතිකම් ආදී 33%ක දේ පක්ෂයට ලැබෙන බව පැවසූ බව ද භාණු මුණිප්‍රිය මැතිතුමා සජිත් ප්‍රේමදාස මැතිතුමා දිනන බව පවසා වැඩ කටයුතු කළ බව ද පාර්ලිමේන්තු මැතිවරණයට තම පක්ෂයෙන් දෙදෙනෙක් ඉදිරිපත් වූ නමුත් ඔවුනට සහය එතුමා ලබා නොදුන් බව ද තමන්ට මන්ත්‍රීකම ලැබුණේ බාධා මධ්‍යයේ බව ද එවැනි දුර්වල සංවිධායකයෙක් බැවින් එතුමා සමඟ දේශපාලනය කිරීමට තමන්ගේ කැමැත්තක් නැති බව ද පවසන ලදී.

එමෙන්ම තුරු උයන නිර්මාණය වූ ඉතිහාසය සභාවට පැවසූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා තමන් නගර සභාවට තානායම ලබා ගැනීම වෙනුවෙන් වෙහෙස මහන්සි වූ බව ද තානායමට පිවිසෙන ස්ථානයේ වලවල් සෑදී ඇති අතර, ෆිල්ටරයේ පිරී එන ජලය නිසා ගඳක් පවතින බැවින් මේ සම්බන්ධව අවශ්‍ය පිළියම් යොදන ලෙස ද තානායමේ ලයිට් සාදා දෙන ලෙස ද එක් අවස්ථාවක දී තානායමේ ටෙන්ඩරය ලබා ගත් අය එය මාස තුනක්වත් නොකරන ලද බව ද ඉන්පසු එරික් යන අය තානායම ටෙන්ඩර් ලබා ගෙන කරගෙන යන බව ද විශාල මුදලක් වැය වෙන බැවින් එය පහසු කටයුත්තක් නොවන බව ද පසුගිය කාලයේ ලයිට් කණුවල ආලේප කළ කොළපාට තීන්ත ඉවත් කර සුදු පාට තීන්ත ගාන ලෙස ද පවසමින් ගරු සභාපතිතුමාට නීරෝගීව සභාව විරාත් කාලයක් කරගෙන යාමට වාසනාව ලැබේවායි ප්‍රාර්ථනා කර, තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ප.ව 2.04 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සභාවෙන් පිටවන ලදී.**

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා අදහස් දක්වමින් පසුගිය දිනක වලව්වේ පැවතියේ ජනතා විමුක්ති පෙරමුණෙහි සමුළුවක් නොව බළන්ගොඩ විද්වත් සංධානයේ රැස්වීමක් බව ද ඒ සඳහා අවශ්‍ය මූලික යටිතල පහසුකම් සැලසීම සිදු කළ බව ද ජාතික ජන බලවේගය නමින් සංවිධානයක් ගොඩනැගූ බව ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් සිංහල අලුත් අවුරුද්ද වෙනුවෙන් දෙරණ ආයතනය සමඟ එක්ව බළන්ගොඩ ආදි ශිෂ්‍ය සංගමය විසින් අවුරුදු උත්සවයක් පැවැත්වීමට බළන්ගොඩ ක්‍රීඩාපිටිය ලබා දෙන ලෙස ඉල්ලීමක් පවතින අතර, ඒ සඳහා ක්‍රීඩා පිටිය ලබා දෙන ලෙස ද

බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අසනීපව සිටින නිළධාරිනිය වෙනුවෙන් කරන ලද ඉල්ලීම අනුව සභාපති අරමුදලින් මුදලක් පරිත්‍යාග කිරීම සම්බන්ධව ස්තුතිවන්ත වන බව ද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා වැඩ ලක්ෂය කරයිද යන්න නොදන්නා බව පැවසූ අතර, තමන්ගේ කොට්ඨාසයේ නම් වැඩ කෙරෙන බව ද කාපට් ව්‍යාපෘතිය මගින් මාර්ග 03ක වැඩ අවසන් කළ අතර, බුලත්ගම විද්‍යාල මාවතේ මේ වන විට ලක්ෂ 1200 ක ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන බව ද මිනිසුන් අමාරුවෙන් ජීවත් වන බව සත්‍යයක් වන අතර, ජීවනෝපාය ව්‍යාපෘති සමග ඒ දේවල් හරි යන බව ශෂේන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා පැවසූ බව ද පවසන ලදී.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා ජාතික ජන බලවේගය නමින් සංවිධානයක් ගැන පැවසුව ද එහි ජනතා විමුක්ති පෙරමුණෙහි අය දකින්නට සිටින බව ද යම් කිසි දිනක රාජ්‍ය බලය ලබා ගත හොත් විදේශ ණය ගෙවන ක්‍රමවේදය සහ සමාජවාදී රටවල් නොමැති නිසා රාජ්‍ය පාලනය කරනු ලබන ක්‍රමවේදය පැහැදිලි කරන ලෙස ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා පිළිතුරු ලබා දෙමින් චීනය, කියුබාව, වියට්නාමය, උතුරු කොරියාව වැනි රටවල් ගණනාවක සමාජවාදය පවතින අතර, මෑතක දී තවත් රටවල් ගණනාවක නායකයන් බලයට පත් වූ බව ද විදේශ ණය ගෙවන බව ද ඒ සඳහා ප්‍රතිව්‍යුහගත කරන බව ද ඒ කටයුතු කාලානුරූපීව සැලසුම් කරන බව ද ජාතික ජන බලවේගය පක්ෂයක් නොව සංවිධානයක් බව ද පවසන ලදී.

අනතුරුව කොම්පෝස්ට් ව්‍යාපෘතිය සම්බන්ධ ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා අවශ්‍ය කරුණු සාකච්ඡා කර ගැනීමට ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාල කරුණු සාකච්ඡා කර ගැනීමෙන් පසු ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත් කරන ලදී.

**ප.ව 2.17 ට පමණ ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා සභාවෙන් පිටවන ලදී.**

**ප.ව 2.25 ට පමණ ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමයි සභාවෙන් පිටවන ලදී.**

**13. අවසානය**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් තමන්ගේ ජීවිතයේ කිසිම දෙයක් පහසුවෙන් ලැබී නැති බව ද සභාපතිකම් මන්ත්‍රීකම් පවා ගත්තේ බාධාවන් මධ්‍යයේ බව ද තමන් ජීවිතය අත හරින්න උත්සාහ කරන කෙනෙක් වන අතර, 100% ක් වෙනස් පුද්ගලයෙකු බව ද කෙළින් කතා කරන අතර, බෞද්ධ දර්ශනය විශ්වාස කරන බව ද තමන් පන්සිල් පද පහෙන් තුනක්ම 100%ක් ආරක්ෂා කරන අතර ඉතිරි පන්සිල් පද දෙක 99% ක් ආරක්ෂා කරන බව ද තම මංගල මහ සභාවේ කිසිවෙකුගේ හිත් රිදවීම් කිරීමට අකමැති බව ද මෙහි න්‍යාය පත්‍රය ක්‍රියාත්මක වන ආකාරය, න්‍යාය පත්‍රයේ විශේෂ කරුණු සාකච්ඡා කර සභා අනුමැතිය ලබා ගෙන ක්‍රියාත්මක කරන දේ ගරු මන්ත්‍රීවරුන් දැනගත යුතු බව ද සභාව අතරතුර හා පසුව

පවා යෝජනා ලබා දෙන අතර, එම යෝජනා නීත්‍යානුකූල නැති බව ද යම් විශේෂ කාරණයක් නම් සභාපතිතුමාගේ අනුමැතිය ඇතිව න්‍යාය පත්‍රයට ඇතුලත් විය යුතු බව ද ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා පැවසූ පරිදි නීත්‍යානුකූල ක්‍රමවේදය අනුගමනය කරන බව ද පවසන ලදී.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා තමන්ට අසාධාරණකම් නොකළ බව පැවසූ අතර, එතුමා සභාවේ රැඳී සිටියේ නම් එම අසාධාරණකම් පවසන බව ද තමන් මිරිස් වගාව මඟින් විශාල ආදායමක් ලබන බව ද එක් එක් චෝදනා එල්ල වුව ද තමන් කිසි දිනක හොරකම් කර හෝ නෑදෑ හිතවතුන් රැකියාවලට යොදවා නොමැති බව ද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා තමන් අතින් වැරැද්දක් වූ විට එය පිළිගන්නා බැවින් එයට තමන් ගරු කරන බව ද තමන්ගේ මනාප අඩු කිරීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග ගත් නමුදු තමන් ජයගත් බව ද පක්ෂ ආගම් කුමක් වුවත් මිනිසුන් සමග මනුෂ්‍යත්වයෙන් සිටින නිසා ජනතාව තමන්ව විශ්වාස කරන බව ද තමන් පත් වූ අවස්ථාවේ පිළිගැනීමේ උත්සවයක් සූදානම් කළ අතර, තමන් වෙනුවෙන් දැමූ බැනරය පවා තමන් කැපූ බව ද කෙටිකාලීනව වැඩසටහනක් සූදානම් කර එය ක්‍රියාත්මක කරන බව ද කිසිවෙකුට අසාධාරණයක් සිදු නොකරන බව ද තානායම සම්බන්ධ ලිපිය අද දිනම ලබා දෙන බැවින් අවශ්‍ය කටයුතු සිදු කර ගන්නා ලෙස ද තමන්ගේ අසනීප තත්ත්වය මත යම් අවදානමක් පවා පවතින නමුත් සභාපති වීම සම්බන්ධව පොඩි හෝ සතුටක් ලැබුණු බව ද සිටින කෙටි කාලය තුල නිවැරදිව වැඩ කටයුතු කිරීමට උපරිම උත්සාහය ගන්නා අතර, ඒ සඳහා සියලුම දෙනාගේ සහයෝගය අපේක්ෂා කරන බව ද මාධ්‍යවේදී දීමනාව සම්බන්ධව ලබා දුන් පොරොන්දුව අද දින ඉටු කළ බව ද පැවසීය.

අනතුරුව අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් සියලු දෙනාට ස්තුතිය පළ කරමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු ප.ව.2.55 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.ඒ.වසන්ත ගුණරත්න,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.